

# إلى متى العصيان؟

# පවෙන් ඉවත් වන්නෙ කවදාද?

باللغة السنهالية

# පවෙන් ඉවත් වන්නෙ කවදාද?

දාර් අල් වතන්හි ප්‍රකාශනයක්

සිංහලෙන්
අබ්දුල් හකීම් මුහියිද්දීන්

නිරීක්ෂණය
මුහම්මදු නාසිම්

ح المكتب التعاوني للدعوة والإرشاد بالشفا ، ١٤٢٤هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

دار الوطن (الرياض)

الى متى العصيان؟. .- الرياض، ١٤٢٤هـ

٦٠ ص؛ ١٢ × ١٧ سم

ردمك: ١ - ٥٢ - ٨٤٣ - ٩٩٦٠

(النص باللغة السنهالية)

١- المعاصي والذنوب ٢- الاخلاق الاسلامية أ. محي الدين، عبدالحكيم (مترجم) ب. العنوان

ديوي ٢١٢,٣ ١٤٢٤/٧٨

رقم الإيداع: ١٤٢٤/٧٨

ردمــك: ١ - ٥٢ - ٨٤٣ - ٩٩٦٠

حقوق الطبع محفوظة

١٤٢٤هـ - ٢٠٠٣م

بسم الله الرحمن الرحيم

# පෙරවදන

**ප්‍ර**ශංසනීය සියල්ල සර්වඥාන අල්ලාහ්ට අයත්වේ. ඔහු ප්‍රශංසා කර ඔහුගෙන්ම සහාය පතා සිටිමු. අපගේ පාප යන් හට ඔහුගෙන්ම පවසමා අයදිමු. පව සහ නින්දිත ක්‍රියාවන් හට ලක් නොවී සිටීමටද ඔහුගෙන්ම සහාය පතමු. කරුණාබර අල්ලාහ් පෙන්වන යහමග කවරෙකුට ලැබෙන්නේද, හෙතෙම නොමග යැවීමට කිසිවෙකුට කළ නො හැකිය. එමෙන්ම අල්ලාහ්ගේ යහමග කවරෙකුට නොලැබෙන්නේද, ඒ තැනැත්තා යහමගට කිරීමට කිසිවෙකුට කළ නොහැකිය. තවද වැඳීමට සුදුසු එකම සත්‍ය දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බවත්, මුහම්මද් තුමා අල්ලාහ්ගේ කීකරු අතවැසියා සහ අවසාන වක්තෘවරයා බවත් මම සාක්ෂි දරමි.

හිතවත් සහෝදරවරුනි,

අප සිතට වහල් වී පරමාධිපත්‍ය දෙවිඳුගේ ආඥාවන් නොතකා වැරදෙහි නියලෙන විට එහි මුල මිහිරක් ගෙන දෙන්නට හැකි එකක් ලෙස වුවද එහි අවසානය අන්තරා සහගතවද පවතින්නේය. තවද වැරදෙහි නියලෙන්නෙක් වරදෙහි බැඳී සිටින කල සමහර විට වහා ඒ මගින් මිහිරක, සතුටක සුවයක් වින්දද, එය ව්‍යාජ ඔහු විනාශ කර දමන්නට හැකි තරම්වූ මිහිරක් වන්නේය. ඒ මිහිර ද ඔහු සමග සුළු කලක් පමණක් පවතිනවා මිස දීර්ඝ සතුටක් ගෙන දෙන්නට නොහැකියි. ඔහු එසේ නොමනා අන්දමින් වැරදෙහි බැඳෙන කළ ඔහුගේ නිර්මාතෘවරයා ඔහු කෙරෙහි දරුණු අන්දමින් උරණ වන්නේය. ඔහුට අයත් නොවූ,

නියම නොවූ, ආඥා නොවූ දෙයක් කිරීමට ඔහු උත්සාහ කරන්නේය. තම නිර්මාතෘ වරයාගේ ආඥාවන් හට පිටුපා වරදෙහි යෙදෙන ඔහු නිර්මාතෘ වරයා සමග සටන් වැදීමට කැරැළි බැඳ ගත් කෙනෙකු ලෙස හැඳින්විය හැකිය. යමෙකු මෙසේ සම්පූර්ණයෙන්ම තම නිර්මාතෘ වරයාගේ පරමාධිපත්‍ය ආඥාවන් හට පිටුපා කටයුතු කරද්දී ඔහුගේ සිත සතුටක සුවයක්, සන්සුනක්, සෞභාග්‍යයක් ලබන්නේ කෙසේද? ඒ කරුණ අළ්ලා අල්ලාහ් දෙවිඳු අල්කුර්ආයේ මෙසේ විස්තර කරයි :

﴿وَمَن يَعْصِ اللَّهَ وَرَسُولَهُ وَيَتَعَدَّ حُدُودَهُ يُدْخِلْهُ نَارًا خَالِدًا فِيهَا وَلَهُ عَذَابٌ مُّهِينٌ﴾

යමෙක් අල්ලාහ්ටද සහ අල්ලාහ්ගේ රසූල් වරයාටද අකීකරු වී ඔහුගේ සීමාවන් ඉක්ම වන්නේද ඔහු සදාකල් හී එහි වනු පිණිස නිරයේ ගින්නෙහි ඇතුල් කරනු ලබනු ඇත. ඔහුට එහි නින්දනීය දඬුවම් වේ.(4 : 14)

තවද පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

﴿وَمَن يَعْصِ اللَّهَ وَرَسُولَهُ فَقَدْ ضَلَّ ضَلَالًا مُّبِينًا﴾

යමෙක් අල්ලාහ්ට සහ ඔහුගේ රසූල් වරයාට අකීකරු වන්නේද ඔහු ප්‍රකට දුර්මාර්ගයෙහි වේ.(33 : 36)

අඛණ්ඩ දුක

සුප්‍රසිද්ධ ඉස්ලාමීය විද්වතෙකු වන ඉමාම් ඉබ්නුල් කයියූම් ජව්සි තුමා මෙසේ විස්තර කරයි :

ඉස්ලාම් දහම තහනම් කළ දේ ගැන නුවණැසෙන් බලන්නේ කවරෙක්ද හෙතෙම යහපත් දේවල් ලබා ගන්නා අතර එහි ඇති විය හැකි දුදනෙන්ද තමා ආරක්ෂා කර ගෙන ජය අත්පත් කර ගන්නේය. තවද එහි අවසාන විපාකය වටහා ගැනීමට අපොහොසත් වන කල ඒ දුදන කිරීම කෙරෙහි ඔහුගේ හැඟීම් පාලනය කර ගන්නට බැරිව ඉහාවහා යන්නේය. එසේම ඔහුගේ සිත කැලඹිල්ල අධික වී ඔහු කුමක් මගින් සිත් සතුටක් බලාපොරොත්තු වූවාදෝ එය ඔහුට දුර්විපාක යක්ද, ඔහු කුමකින් සන්සුනක් බලාපොරොත්තු වූවාදෝ එයට හාත්පසින් විරුද්ධ විපාකයක්ද එය ඔහුට ලබා දෙයි.

අතීතයේ ඔබ කටයුතු කළ ආකාරය ගැන මදක් අනාගතයේ හෝ වත්මනයේ හෝ කල්පනා කර බලන කල ඔබ අල්ලාහ්ගේ ආඥාවන් හට කීකරුව් කටයුතු කළ කෙනෙකු හැටියට හෝ අල්ලාහ්ගේ ආඥාවන් හට අකීකරු වී කටයුතු කළ කෙනෙකු හැටියට හෝ මනාව දැන ගන්නේය. ඔබ එසේ දුදනෙහි එල්බ කටයුතු කළ කෙනෙකු වන්නේ නම් එයින් ඔබ ලබා ගත් සතුටට කුමක් වීද? ඔබ අල්ලාහ්ට කීකරුව් කටයුතු කළ නිසා පත් වූ මහන්සියට දුෂ්කරයට කුමක් වීද? ඒවා සියල්ල දැන් ඔබගෙන් ඉවත් වී ගොස් යැයි කිව හැකිය. එසේම ඔබ අල්ලාහ් දෙවිඳු විසින් පනවන ලද ආඥාවලට කීකරු වී දුදනෙහි නිරත නොවී සිටියා නම් ඒ දුක් කරදරද ඔබට හිංසා නොකරන්නට හැකි නොවේද?

මෙම කරුණ ගැන තවත් සවිස්තරව පවසනවා නම් ඔබ මැරෙණ මොහොත ගැන මදක් සිතා බලන්න. ඔබ මෙතෙක් කල් ඔබගේ නිර්මාතෘවරයාට අකීකරු වී නොසැළකිල්ලෙන් ගෙවා දැමූ විශාල කාල පරිච්ජේදය

ගැන මදක් සිතා බලන්න. ඔබගේ නොසැළකිල්ලෙන් අත්වූ විපාකය සහ පාඩුව ගැන මදක් සිතා බලන්න. ලෞකික සැපසම්පත්, සුකුමාර ජීවිතය කෙසේ ජය ගන්නවාද යන්න ගැන විස්තර කිරීම මෙහි පරමාර්ථය නොවෙ. මන්දයත් එවැනි මිහිරත් පසුව අමිහිරි දුකක්, නොසන්සුනක් බවට පත්ව එයට මුහුණ දෙන්නට බැරිව පසුව විශාල දුකක් බවට පරිවර්ථනය වී ඒවා හිරිහැරයන් බවට පත් වන්නට හැකි ඉඩකඩ අපමණය නිසාය. තවද සියලු කටයුත්තන් එහි අවසානය මත තීරණය වන බව නොකිව මනාය. එහෙයින් සිතට වහල් වී කටයුතු කර පසුව කණස්සල්ලට පත් නොවී ඔබගේ අවසානය ගැන මදක් සිතා බලා එය සුඵල ගෙන දෙන අයුරු කටයුතු කර මැරෙන්නට වග බලා ගැනීම ඔබගේ පරම යුතුකමකි.

කවියෙකු මෙසේ විස්තර කරයි:

හැබැවින් ඔබ දිවිමග දිගය,
ඒ දිග වියතක් වැනි තරම් කෙටිය
ඒ වියත සුලියක් වත් සුළු දෙයය
එහෙයින් ඔබ වෙනුවෙන්
මිනිවලක් සකස් කර ගනු මනාය!

ලෞකික ජීවිතයේ හරය සහ ඒ ගමනේ දුෂ්කර දීර්ඝ මාවත ගැන මදක් සිතා බලා ඒ ගැන වටහා ගත්තේ කවරෙක්ද හෙතෙම ඒ වෙනුවෙන් යහපත් අවවාද සහ මවදන් ලබා සූදානම් වනු ඇත.

හිතවත් සහෝදරවරුනි,

- සිතට වහල් වී සිතුමතේ ක්‍රියා කිරීමෙන් වළකී සිටීම පහසු කරුණක් නොවෙ. එය විශාල වගකී

මකි. නමුදු එසේ වරදෙහි බැඳී වරද කර ඒ මගින් ලැබිය හැකි අති විශාල අඩුවම කිසිසේත් විඳ දරා ගන්නට බැරි බව වටහා ගන්න. මන්දයත් ඒ වැරැද්දි වේදනීය අඩුවම් ලබා දිය හැකි නිසාය.

- එහි තාවකාලික සතුටට වඩා නිශ්චිත සතුට ගෙන දිය හැකි අවස්ථාව විසන්ධි වී යා හැකිය.
- ඔබගේ වටිනා කාලය නිකරුණේ ගෙවා දැමීමට අවස්ථාව උදා කර දෙනු ඇත.
- එසේම විශේෂයෙන් සැළකිය යුතු යමෙකුගේ වටිනා චරිතය විනාශ කළ හැකිය.
- ඉතිරි විය යුතු ඔබගේ වටිනා සේසත්ද අනිවාර්යෙන් වියදම් කර විනාශ වන අයුරු සලස්වනු ඇත.
- ඔබගේ උසස් තත්ත්වය නිහීන කරනු ඇත.
- ඔබ වෙත පහසුවෙන් සමීප විය නොහැකි නිහීනයෙකු සමීප වීමට මගක් සළස්වා දෙන්නේය.
- ඔබ තුල කිව නොහැකි සිත් වේදනාවක් සහ බියක් ඇති කරනු ඇත.
- ඔබ හදාරා ඇති වටිනා දැනුම අමතක කිරීමට මගක් සැළසෙනු ඇත.
- සුදනෙකු දුකට පත් කිරීමට හෝ සතුරෙකු ඇති කර ගැනීමට හෝ තමා වෙත ලඟා විය හැකි අනුග්‍රහය වළක්වා ගැනීමට හෝ මගක් සැළසෙනු ඇත.
- ඔබෙන් කිසිවිටෙක ඉවත් නොවන පාඩුවක් හෝ අහිතක් සදා ඔබ මත ඇති කරනු ඇත.

## සුළු පව් වහා කිසිදු අහිතක් ඇති නොකරයි

අද බොහෝ දෙනෙකු දැන දැන හෝ නොදැන හෝ සුළු සුළු පව්වල නිරත වෙමින් කාලය ගෙවා දමති. තමන් විසින් කරන ඒ පව්වලට වහා ප්‍රතිවිපාක හෝ අඩුවම් නොලබන හෙයින් ඒවායින් තමන්ට කිසිදු අහිතක් නපුරක් ඇති නොවන බවද ඒවා සමාවූ බවද නිගමණය කරති. එසේ තම සිත්සේ තීරණයකට එළඹෙමින් කටයුතු කළ නිසා පෙර බොහෝ සමාජයන් අල්ලාහ් දෙවිඳු විසින් විනාශයට පත් වූ බව අමතක වී කටයුතු කරති. මන්දයත් සමහර දුදන ක්‍රියාවන් වෙනුවෙන් වූ විශාල අඩුවම සහ දරුණු ප්‍රතිවිපාකය ප්‍රමාධ වී පසුදිනක අනතුරු සහිතව අප වෙත ලඟා විය හැකි බව අමතක කළ නොහැකිය.

- ප්‍රබල ඉස්ලාමීය විද්වතෙකු වන ඉමාම් අහ්මද් බින් හන්බල් තුමා තම සුහ්ද් නම් ග්‍රන්ථයේ මුහම්මද් බින් සීරින් තුමා ගැන මෙසේ විස්තර කරයි: එතුමා ණය බරෙන් මිරිකී සිටි අවස්ථාවක කණස්සල්ලට පත්වෙමින් මෙසේ පවසා ගත්තේය: ‘අවුරුදු හතළිහක් තිස්සේ මා කළ පව් නිසා මේ තත්වය මට ඇතිවුනු බව මම දනිමි’.
- නිතර වන්දනාමානයෙහි සහ අනෙකුත් ආගමික කටයුතුවල යෙදුණු බියබැති සමහරුන් කලකින් දුටු කාන්තාවකයේ ලක්ෂණය සහ යහපත් ගුණ ධර්මයන් කෙරෙහි බලා සීමාව ඉක්මවා ප්‍රීති වූහ. ඒවා ගැන විමසුමෙන් කතා කළහ. එවිට මවුන්ගේ සිහිනයෙහි කෙනෙකු පැමිණ ‘ඔබලා ඒ කාන්තාව කෙරෙහි නොමනා අන්දමින් බැලූ නිසා එහි

විපාකය අවුරුදු හතළිහකින් ලබා ගනු ඇත' යනුවෙන් අනතුරු අඟවා පැවසුවේය.

- යහ්යා බින් මආද් අල් රාසි තුමා මෙසේ විස්තර කරයි: සමහර බුද්ධිමතුන් සතුරන්ගේ දුදන ක්‍රියාවන්හී බරපතල කම වටහා ගෙන 'දෙවියනි, මගේ සතුරන් මා කෙරෙහි බලපෑමක් ඇති කිරීමට පත් නොකරනු' යනුවෙන් අයදින ප්‍රාර්ථනාවන් ගැන මම මවිතයට පත් වෙමි. මන්දයත් මවුන් එසේ ප්‍රාර්ථනා කර මවුන්ම අල්ලාහ්ට විරුද්ධව ඒ අයුරින් පාපකර්මයන් කර පරමාන්ත දිනයේ සියලු සතුරන් මවුන් කෙරෙහිම පටවා ගනිති.
- නවද සමහරු පාපකර්මයන් වෙනුවෙන්වූ අඩුවම වහා ලබන හෙයින් ඒ අඩුවම අසවල් පාප කර්මය නිසා ඇති වුනු බව වටහා ගන්නේය. 'යමෙකු රහසෙන් පවක නිරත වෙයි. පසුව හෙතෙම නිහීන කෙනෙකු බවට පත් වෙයි. එහෙයින් කවදා හෝ ඔබට නිහීන දෙවයක් අත් වූ විට එය ඔබ කළ වරදකින් ඇති වූ බව අමතක නොකරනු' යනුවෙන් සුලෙයිමාන් අල් තමීමි තුමා පවසයි.
- ෆුළයිල් බින් ඉයාල් තුමා මෙසේ පවසයි: මා යම් වරදක නිරත වූ බව එය මගේ ළමයින්ගේ සහ මගේ සතුන්ගේ ගුණදහම් වෙනස් වීමෙන් වටහා ගනිමි.
- සුප්‍රසිද්ධ විත්වතෙකු වන සුලෙයිමාන් බින් අල් ධාරම් තුමා මෙසේ පවසයි : සියළු දේ කෙරෙහි නිහත මානීව කටයුතු කරන්නේ කවරෙක්ද ඔහුගේ ජීවිත යද පිරිසිදු නිහතමානීව පසුවනු ඇත. නොසන්සුන

සහ කරදර ඇති කරන්නේ කවරෙක්ද ඔහුගේ ජීවිතය නොසන්සුනෙන් සහ කරදරවලින් පිරුණු එකක් වනු ඇත. එසේම දිවා කාලයේ යහකර් මයන්හී නිරත වන්නේ කවරෙක්ද ඔහු රෑයේ එහි සුවිපාකය ලබා ගනු ඇත.

### පෙර සමාජය විනාශ වීමට පව හේතුවක්

හිතවත් මුස්ලිම් සහොදරයානනි,

ලොවෙ නන් දෙස විසූ පෙර සමාජ වැසියන් විනාශ මුඛයට පත්වීමට ප්‍රධාන හේතු ගැන සළකා බලද්දී ඔවුන් අත්තනෝමතික අන්දමින් කළ පව සහ නොහෙබිනා ක්‍රියාවන් යැයි සක්සුදක් සේ පැහැදිලි වනු ඇත. පෙර දිනවල එසේ විනාශයට පත්වූ ප්‍රකට සමාජයන් ගැන අල්ලාහ් දෙවිදු අල්කුර්ආයේ මෙසේ විස්තර කරයි:

﴿فَكُلًا أَخَذْنَا بِذَنبِهِ فَمِنْهُم مَّنْ أَرْسَلْنَا عَلَيْهِ حَاصِبًا وَمِنْهُم مَّنْ أَخَذَتْهُ الصَّيْحَةُ وَمِنْهُم مَّنْ خَسَفْنَا بِهِ الأَرْضَ وَمِنْهُم مَّنْ أَغْرَقْنَا﴾

එබැවින් අපි එකිනෙකා ඔවුන්ගේ පාපයෙන් අල්ලා ගතිමු. ඔවුන්ගෙන් සමරුන් මත (සැඩසුළං මගින්) ගල් වරුසාද යැවිමු. ඔවුන්ගෙන් සමහරෙකු බිහිසුනු හෙන හඬින් හසු කර ගත්තෙමු. ඔවුන්ගෙන් (කාරූන් වැනි උඩගු ලෙස ජීවත්වූ) සමහරෙකු පොලෙව ගිල ගන්නට සැළැස්සුවෙමු. ඔවුන්ගෙන් සමහරෙකු ජලයේ ගිල්වා දැම්මෙමු.(29 : 40)

තවද මෙලොව හෝ වේවා මතුලොව හෝ වේවා මිනිසා කරන දුදන ක්‍රියාවෙන් සහ පාප කර්මයන්ගෙන් මිස කිසිදු කරදරයන් ඇති වන්නේ නැත. මිනිසා හිතුමතේ ක්‍රියා කරන විට දොලොවම නොසන්සුන් වෙයි.

- කිසිවෙකු විසින් වර්ණනා කළ නොහැකි සකලවිධ ප්‍රමුදිතයන්ගෙන් සහ ප්‍රමෝධයෙන් පිරුණු ස්වර්ග යෙන් අපගේ මුල් මිනිසුන් පිටමං කළේ කුමක්ද?
- සුර ලොවේ සුර දූතයන් සමඟ වැජමෙමින් සිටි ෂයිතාන් අල්ලාහ් විසින් දරුණු අන්දමින් ශාප කර, ඔහුගේ පිට සහ ඇතුළත විරූපි ලෙස වෙනස් කර, වෛර කර පළවා හැර මෙලොවට පහළ කළේ කුමක් නිසාද?
- කිසිවෙකු බලාපොරොත්තු නොවූ අන්දමින් මහා ජල ගැල්ම ගිරිශිකරයන්ද පරයා ඉහළින් ගලා යන අයුරු අධික කර වක්තාංඹ නූහ් තුමාගේ නෑයන් සහ සමාජයේ වැසියන් ජල ගැල්මෙන් ගිල්වා විනාශ කර දැමීමේ කුමක් නිසාද?
- පමරාන්ත දිනය දක්වා සළකුණක් ලෙස වන අයුරු ආද් සමාජ වැසියන්ද ඔවුන්ගේ සේසත්, ගෙවල්, කෘෂිකර්ම ව්‍යාපූර්තීන් සහ සතුන් විනාශ කර දැමීමේ කුමණ හේතුවක් නිසාද?
- සමූද් වැසියන්ගේ හදවත් කම්පා වන අයුරු ඔවුන්ගේ දේහයේ විවරයන් තුලින් කන බිහිරි කරවන විශාල ගෙහන හඬ අතුල් කර ඔවුන් මරණයට පත්වන තුරු අඬුවම් කළේ කුමක් නිසාද?
- සුනබයන්ගේ බිරුම් පෑඬ පවා සුර දූතයන් සවන් දෙන තරමට ඉහළට උස්සා, අපුල සහගත සම ලිංක

සේවනයේ යෙදුනු වක්තෘ ලූත් තුමාගේ සමාජයේ ජීවත් වූ ඒ වැසියන් ඔහුන් යටිකුරුව පෙරලා තවද මවුන් මත අහසෙන් ගල් වරුසා පහළ කර අන් කිසිදු සමාජයට නොදුන් බිහිසුණු අඬුවම් ලබා දී මවුන් විනාශයට පත් කළේ කුමක් නිසාද?

- මිසරය අරාජක ලෙස රජ කළ පිර්අවුන් සහ ඔහුගේ දුදන සේනා වැසියන් මහ මුහුදේ ගිල්වා මවුන්ගේ ආත්මයන් නොහොත් පණ නිරයේ ගින්නටත් කඳ ජලයටත් හසු කළේ කුමක් නිසාද?
- උඩඟු ලෙස හැසිරුණු කාරූන් සහ ඔහුගේ පවුලේ අය සහ ඔහුගේ සේසත් මහපොළෙවේ ගිල්වා ගන්නට සළස්වා පළි ගත්තේ කුමක් නිසාද?
- වක්තෘ නූහ් තුමාට පසුව මිහිපිට ජීවත්වූ තවත් බොහෝ දියුණු ජන සමාජයන් දරුණු අඬුවමට භාජණය කළේ කුමක් නිසාද?
- බියබැති අතවැසියෙකු වන යාසීන්ගේ සමාජයේ අය විශාල ශබ්දයකින් විනාශ කළේ කුමක් නිසාද?
- ඉස්රායෙල් සමාජ වැසියන් හා දැඩි කෝපයට පත්වූ ප්‍රමාණයෙන් සුළු වූ සමාජ වැසියන් පිටත් කර මවුන්ගේ ගම්වලට ගොස් තතු සොයා මවුන් සහමුලින් ඝාතනය කරද, මවුන්ගේ ස්ත්‍රීන් සහ ළමයින් හිර කරද, මවුන්ගේ ගෙවල් ගිනිබත් කර විනාශ කිරීමට සැළැස්වූයේ කුමක් නිසාද?
- තවද ඒ ඉස්රායෙල් ජනයන්ගේ ඉතිරි වූ පිරිමින් ඝාතනය කරද, මවුන්ගේ ස්ත්‍රීන් සහ ළමයින් හිර කරද, මවුන්ගෙන් ගම්නියම්ගම් විනාශ කරද, මවුන් කෙරෙහි දුදන රජ්ජු කෙනෙකු පත් කර මවුන්

වඳුරන් සහ සූකරයන් ලෙස පරිවර්ථනය කර විවිධාකාර දඬුවම් වලට භාජනය කළේ කුමක් නිසාද?

- තවද තමනතර හෝද බින්තවී එකා අනෙකාගේ බෙල්ල මිරිකා ගන්නා තරමට සණ්ඩුදබර ඇති කර දුදන ක්‍රියාවන් ඇති කරන්නේ කුමක් නිසාද?

- තවද යුදෙව්වන් තම ජන්ම පුණ්‍ය භූමිය බලයෙන් අත්පත් කරගෙන එහි ජනයන්ගේ ඉඩකඩම් ගෙවල් දොරවල් අත්පත් කරගෙන එහි කුඩා ළමුන්, කාන්තාවන් සහ වයෝවෘදයන් කපා කොටා දරුණු ලෙස ඝාතනය කරමින් ලොවෙ උතුම් සමාජයක් බවට පත්ව සිටි සමාජ වැසියන් පහත් සමාජ තත්ත්වයට පත් කළේ කුමක් නිසාද?

ඒවා සියල්ලට මුල්ම හේතුව අප දැනදැනම කළ අප්‍රමාණ පව් සහ ව්‍යාති කර්මයන් නොවේද?

- ජුබයිර් බින් නුෆයිර් තුමා මෙසේ පවසයි : සයිප්‍රස් දේශය මුස්ලිම්වරුන් විසින් ජය ගත් විට මවුන් එකිනෙකා දෙස බලමින් භීතියෙන් සහ සන්තාපයෙන් අඬා වැළපෙමින් පසුවූහ. එසේම එහි භූදෙකලාවක අබූදර් පමණක් හිඳගෙන අඬා වැලපෙමින් සිටිනු දුටු කල 'අබූදර්, ඉස්ලාමය සහ මුස්ලිම්වරුන් සම්භාව ණයට පත්ව ඇති මෙවන් දිනයක ඔබ දුකෙන් අඬා වැලපෙමින් පසුවන්නේ මන්ද? යි විමසූවෙමි. එයට අබූදර් 'ජාබිර්, ඔබට කුමක් වීද? කුමණ සමාජයක් වුවද ඒ සමාජය අල්ලාහ්ගේ අණදාවන් හට පටහැනිව අත්තනෝමතික අන්දමින් ක්‍රියා කරද්දී එය විනාශ කිරීම අල්ලාහ්ට එතරම් අසීරු කරුණක් නොව. බලය සහ පාලනය මනා අන්දමින් සරුව තිබුණු කල

අල්ලාහ්ගේ ආඥාවන් හට පිටුපා අත්තනෝමතික ලෙස ව්‍යාති කර්මයන් කරමින් හැසිරුණු නිසා ඔවුන් ශක්තිමත් සමාජයක් විලසින් වැජඹුණු රටේ පාලනය සුළු කොටසකට පත් කිරීම ඔවින වීමට උවමනාව කරුණක්ද?'යි පැවසුවේය.

හිතවත් සහෝදරවරුනි,

අල්ලාහ්ගේ ආඥාවන් අත්තනෝමතික අන්දමින් අමතක කර ඔහුට විරුද්ධව කටයුතු කරන විට අප කුමාකාර මැවීමක් වූවද අපගේ උසස් අය පහත් තත්ත්වයටද, ධනවතුන් දිළිඳුන් ලෙසද, වීරයන් ශක්තිමත් අය නීචයන්, නිහීනයන් සහ පරාජිතයන් ලෙසද, දුර්වල අය උසස් පාලකයන් ලෙසද, පත්කිරීම සර්වබල අල්ලාහ් දෙවිඳුට ඉතා පහසු කරුණක් බව අප අමතක කළ නොහැකිය.

එහෙයින් අල්ලාහ්ගේ දඬුවම සහ වේදනාව සැනෙකින් අප වෙත පැමිණීම ගැන අප අවදාධයෙන් සිටිය යුතුය. අල්ලාහ් දෙවිඳුද අපගේ සියළු කටයුත්තන් නිරීක්ෂණ කරමින් පසුවෙයි. මන්දයත් මිනිසුන් තමන්ගේ දුදන ගතිපැවතුම් සහ ව්‍යාති කර්මයන් වටහා ගෙන තමන් විසින්ම යහමින් වෙනස් කර ගන්නා තුරු අල්ලාහ් ඔවුන් ගැන තමා කෙරෙහි වූ අදහස වෙනස් කර ගන්නේ නැත. මෙයින් අදහස් වන්නේ, එනම් දුදනේ පසුවන්නන් එයින් වැළකී යහමගට පැමිණ කටයුතු කරන තුරු අල්ලාහ් ඔවුන් අත් හැර දමන බවය. මෙම කරුණ විස්තර කරමින් ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

﴿ذَلِكَ بِأَنَّ اللَّهَ لَمْ يَكُ مُغَيِّرًا نِّعْمَةً أَنْعَمَهَا عَلَى قَوْمٍ حَتَّى يُغَيِّرُوا مَا

بِأَنفُسِهِمْ ﴾

මන්දයත් කිසිදු සමාජයක් ඔවුන්ගේ (සිතේ ඇති) ස්වභාවය (සහ ක්‍රියාවන්) තමන්ම (විසින්ම) වෙනස් කරන ගන්නා තුරු අල්ලාහ් ඔවුන් වෙත හෙළූ අනුග්‍රහය වෙනස් කරන්නෙ නැත.(8 : 53)

තවද එසේ අකෘතඥා අන්දමින් කටයුතු කරන්නන් හට අල්ලාහ් දෙවිඳු විපාකය ලබා දෙන්නේය. ඒ ගැන පරිශුද්ධවූ අල්කුර්ආනය තුලින් අල්ලාහ් දෙවිඳු මෙසේ පැහැදිලිව විස්තර කරයි :

﴿وَإِذْ تَـأَذَّنَ رَبُّكُمْ لَئِن شَكَرْتُمْ لأَزِيدَنَّكُمْ وَلَئِن كَفَرْتُمْ إِنَّ عَذَابِي لَشَدِيدٌ﴾

ඔබලා (මට මගේ ආඥාවන් පිළිපැද) කෘඥා වන්නේ නම් සැබැවින්ම මම (මගේ අනුග්‍රහය ඔබට) අධික කරමි. ඔබලා අකෘතඥා වන්නේ නම් ඇත්තෙන්ම මගේ දඬුවම දැඩි කරමි යි දෙවිඳු පැවසූවේය. (14 : 7)

පාපයේ මූල

ඉමාම් ඉබ්නුල් කයියූම් ජව්සි තුමා මෙසේ විස්තර කරයි :

- යමෙකු කරන සුළු පව් හෝ වේවා විශාල පව් හෝ වේවා ඒ තුලින් අල්ලාහ් හැර අන් ඒවා කෙරෙහි තම සිත ඇදී යෑම.
- තම කොපයට වහල් වීම.
- හැඟීම්වලට වහල් වීම.

අප ඉහත සඳහන් කළ කරුණු අන් ආකාරයකින් පවසනා නම් ආදේශ කිරීම, අපරාධ කිරීම සහ දුදන ක්‍රියාවන්හි නියළීම යනුවෙන් පැහැදිළි කළ හැකිය.

ආදේශ කිරීමේ දරුණුම ආදේශ කිරීම අල්ලාහ්ට ආදේශ කිරීම වේ. නියම සත්‍ය දෙවිඳු අල්ලාහ් හා අනෙකුත් දෙවියන් යැයි පවසන ව්‍යාජ දෙවිවරුන් සහ කිසිවක් කරන්නට බැරි පිළිමයන් අමතා ඒවාට වන්දනාමාන කිරීම වේ. අපරාධයන්හී දරුණුම අපරාධය අයුක්ති සහගත අන්දමින් නිකරුණේ අනුන් ඝාතන කිරීම වේ. දුදනෙහි දරුණුම දුදන සිතට වහල්වී දුරාචාරයෙහි හැසිරීම වේ. මේ මහා පාපකර්මයන් තුනම එකට සම්මිශ්‍රණය කර අල්ලාහ් දෙවිඳු පරිශුද්ධ වූ අල්කුර්ආයේ මෙසේ විස්තර කරයි :

﴿ الَّذِينَ لا يَدْعُوْنَ مَعَ اللَّهِ إِلَهًا آخَرَ وَلا يَقْتُلُونَ النَّفْسَ الَّتِي حَرَّمَ اللَّهُ إِلا بِالْحَقِّ وَلا يَزْنُونَ ﴾

(සත්‍ය වන්තයින් වන මවුන්) කවරෙකු වේ නම් අල්ලාහ් සමග අන් දෙවියෙක් නොඅමතන්නෝය. යුක්ති සහගතව මිස අල්ලාහ් තහනම් කළ කිසිදු ජීවයක් නොනසන් නෝය. දුරාචාරයෙහි නොහැසිරෙන්නෝය.(25 : 68)

තවද අප ඉහත විස්තර කළ අකුසල් කර්මයන්ගෙන් සමහරක් හෝ කරන කල ඒ හා සමාන වූ අනෙක් ඒවාද කිරීමට අනුබල ලබන්නේය. යමෙකු ආදේශ කිරීමෙහි නියළෙන කල එය දරුණු අපරාධ සහ දුදන ක්‍රියාවන් කිරීමටද උනන්දු කරවන්නේය. නමුදු ඒකීය දේව වාදය පිළි ගනිමින් අල්ලාහ්ට පමණක් වන්දනාමාන කිරීමෙහි නිරත වන කල ඒ ස්ථිරසාර ඒකීය වාද

වන්දනාමාන සංකල්පය එවන් අපරාධ සහ දුදන ක්‍රියාවන් අප වෙත ලඟා වීමෙන් මුළුමනින්ම ආරක්‍ෂාව සපයන්නේය.

එසේම අප අපරාධ කටයුත්තන්හී නිරත වන කල එ අපරාධය ආදේශ කිරීම සහ දුදන ක්‍රියාවන් කිරීමට උනන්දු කිරීමට හැකිය. දුදනේ විශාලතම දුදන ආදේශ කිරීම බව නොකිව මනාය. ඒ ගැන අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿ إِنَّ الشِّرْكَ لَظُلْمٌ عَظِيمٌ ﴾

'ඇත්තෙන්ම ආදේශ කිරීම මහත්ම පවක්ම වේ'. (31 : 13)

අප දුදන ක්‍රියාවන්හී නියැළෙන විට ඒ දුදන අප ආදේශ කිරීම සහ අපරාධ කිරීමෙහි උනන්දු කරවන්නේය. එහෙයින් අප මෙ තුන් කරුණුවලින් කුමක් කළද එය අනෙක් කරුණු කෙරෙහි උනන්දු කරවන්නට ඉඩ අධිකව පවතින්නේය.

ඒවායේ කොටස්

තවද ඉබ්නු කයියූම් ජවසි තුමා පවසන කල පාපයන් දෙකොටසකට බෙදිය හැකි බව පවසයි.

- කිරීමට අණ කළ දේවලින් ඉවත් වී සිටීම.
- තහනම් කළ දේ තහනම නොතකා කිරීම.

තවද ඒ එක් එක් කොටස් තවත් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය.

- දුදන ක්‍රියාවන් විවෘතව කිරීම.
- දුදන ක්‍රියාවන් අභ්‍යන්තරව කිරීම.

නවද ඒ දෙක නවත් දෙකොටසකට බෙදිය හැකිය.

- අල්ලාහ්ට කළයුතු යුතුකම්.
- අල්ලාහ්ගේ මැවීම්වලට කළ යුතු යුතුකම්.

පසුව අප ඉහත විස්තර කළ කොටස් නවත් සිව කොටසකට බෙදිය හැකිය.

අල්ලාහ්ට කරන පාපකර්මයන් : අල්ලාහ්ට පමණක් අයත් නම් සහ ගුණාංගයන් වන විශ්වයේ අති උසස් පාලකයා, නිර්මාතෘ වරයා සහ පව් සමාව දෙන්නා වැනි ගුණාංගයන් මිනිසා තමාටද අයත් බව සිතා ඒ අනුව කටයුතු කිරීමට ඉදිරිපත්වන අතර, අල්ලාහ්ගේ නම් සහ ගුණාංග ගැන තමා නොදන්නා කරුණු ගැන පවා දන්නා අයුරින් පැහැදිලි කිරීම පාපයන්ගෙන් දරුණුම පාපය වන අතර විශාල අඩුවම් ද ලබා දිය හැකි වැරැද්ද වේ.

ෂයිතාන් හා සම්බන්ධ පාප කර්මයන් : ඉරිසියාව, වංචාව, කුමන්ත්‍රණ, දුරාචාරය වැනි දූදන ක්‍රියාවන් කරන ලෙස තම සහෝදරයා උනන්දු කිරීම සහ ඉස්ලාම් දහම අනුමත නොකළ නූතන ක්‍රියාවන් කෙරෙහි ආගම යනුවෙන් පවසා ප්‍රිය උපදවා අනුන් එහි නියළීමට කටයුතු කිරීම වැනි ක්‍රියාවන් ෂයිතාන්ගේ කටයුතු ලෙස හැඳින් විය හැකිය. මෙවන් පාපයන් දෙවැනි ස්ථානයෙහිලා සැළකිය හැකිය.

අරාජක වාදී පාප කර්මයන් : කෝපය, සතුරුකම, ඝාතනය කිරීම, දුබලයන් පාගා ගැනීම, ඔවුන් කෙරෙහි භීෂණය මුදවා හැරීම සහ මහජනයන් හට අයුතුකම්

කිරීම වැනි මෙවන් පාප කර්මවලට අයත් ඒවා ලෙස විස්තර කළ හැකිය.

මෘග ගති සම්බන්ධ පාප කර්මයන් : නොමනා අන්දමින් තම ආශාවන් සන්තර්පනය කිරීම, දුරාචාරයේ හැසිරීම, ඒ මගින් අවජාතක ළමයින් බිහිවීමට හවුල් වීම, සොරකම් කිරීම, අනාථයන්ගේ සේසත් වංචා කිරීම, මසුරුකම සහ නිවටකම වැනි ඒවා මෙම කොටසට අයත් වේ. වත්මනයේ කරන බොහෝ පව මේ පනයට අයත් ඒවාය.

## සුළු පව සහ විශාල පව

අල්කුර්ආනය සහ මුහම්මද් නබි (සල්) තුමාගේ හදීස් සංකල්පය තුලින් පව සහ වැරැදීන් මෙසේ සුළු සහ විශාල යනුවෙන් දෙකොටසකට බෙදිය හැකිය. ඒ පව ගැන අනතුරු අඟවා පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

﴿إِن تَجْتَنِبُواْ كَبَآئِرَ مَا تُنْهَوْنَ عَنْهُ نُكَفِّرْ عَنكُمْ سَيِّئَاتِكُمْ﴾

ඔබ තහනම් කරන ලද දැයින් - මහා පාපයෙන් ඔබලා වැළකෙන්නේ නම් ඔබගේ පවත් අප ඔබගෙන් සමා කරමු. (4 : 31)

තවද ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

﴿الَّذِينَ يَجْتَنِبُونَ كَبَائِرَ الإِثْمِ وَالْفَوَاحِشَ إِلا اللَّمَمَ﴾

(යහකම් කරන්නේ කවරෙකු වෙ නම් වැරැදීමකින් සිදුවන) සුළු පව් හැර විශාල පව් සහ දුෂණ දැයින්ද වැළකී සිටින අයවලුන්න්ය. (53 : 32)

තවද මුහම්මද් නබි (සල්) තුමා මෙසේ විස්තර කරයි : 'යමෙකු විශාල පවෙන් ඉවත් වී සිටින කාලය කරන දෛනික දේව නැමදුමේ එක් නැමදුමක සිට අනෙක් නැමදුම දක්වාද, එක් ජුම්ආ සිට අනෙක් ජුම්ආ දක්වා වූ කාලයද, එක් රමළාන් මාසයේ සිට අනෙක් රමළාන් මාසය දක්වා වූ කාලයද, ඒ කාලය අතරවූ ඔහුගේ විශාල පව් හැර අනෙක් පව්වලටද ප්‍රායශ්චිත්තය වෙ. එනම් පව් සමාව වේ' (මූලාශ්‍රය : මුස්ලිම්). තවද මුහම්මද් නබි (සල්) තුමා 'ඔබ විනාශ මුඛයට ඇද ගෙන යා හැකි සප්ත පාපයන්ගෙන් වැළකී සිටින්න යනුවෙන් අනතුරු අඟවා විස්තර කළ විට, අසල සිටි එතුමාගේ කලණ මිතුරන් 'අල්ලාහ්ගේ වක්තෘ තුමනි ඒවා කුමක්ද?' යි ප්‍රශ්නවාචකව විමසූහ. එයට මුහම්මද් නබි (සල්) තුමා අල්ලාහ්ට ආදේශ කිරීම, හූනියම් කිරීම, කිසිදු හේතුව කින් තොරව නහනම් වූ අය ඝාතනය කිරීම, පොලී කෑම, අනාථයන්ගේ සේසත් අයුක්තියෙන් ගිල දැමීම, තමා අනිවාර්යයෙන්ම සහභාගි විය යුතු අවස්ථාවන්හී යුද්ධයේ සිට ආපසු හැරී දිවීම සහ පතිවත් රැක ගනිමින් ජීවත්වන මුස්ලිම් කාන්තාවන්ට අවලාද කිරීම යන්නන් ඒ හත් පාපයන් වෙ' යනුවෙන් පිළිතුරු දුන්හ.

තවත් අවස්ථාවක ඉබ්නු අබ්බාස් තුමාගෙන් විශාල පව් හතක්දයි විමසූ කල එතුමා මෙසේ උත්තර දුන්හ. 'එය හත්සියයකට ආසන්න ප්‍රමාණයකි. නමුදු ඒවා විශාල පව් නොව. එහෙත් පශ්චාත්තාප වී පව්සමා අයැදින කල ඒවාට

අල්ලාහ් දෙව්දුගෙන් සමාව ලැබෙනු ඇත. දැනදැනම ඒ පව් අඛණ්ඩව කරගෙන යන්නේ නම් ඒවා සුළු පව් ලෙස ගණන් නොගෙන විශාල පව් යන තත්ත්වයට පත්වෙය'.

හිතවත් මුස්ලිම් සහෝදරවරුනි, අල්ලාහ්ට හැකි පමණින් බිය වන්න. අල්ලාහ්ගේ ආඥාවන්ට විරුද්ධව කටයුතු කිරීම සුළු කොට නොතකන්න. මන්දයත් සුළු පව් නොකඩවා කර ගෙන යන්නේ කවරෙක්ද සැබැවින්ම හෙතෙම පහසුවෙන් විශාල පව්වලද ඉබේම තියලෙන්නට හැකිය.

විශ්වාස විද්වතෙකු මෙසේ විස්තර කරයි: 'පව් ගැන බලන කල ඒවා සුළු ඒවායැයි නොසිතන්න. වෙනුවට වැරදි කරන්නේ කවරෙක්ද යනුවෙන් පමණක් බලන්න'.

ඉබ්නුල් කයියුම් ජව්සි තුමා මෙසේ විස්තර කරයි:

අප මෙහිදී මනාව වටහා ගත යුතු වැදගත් කරුණක් වේ. කෙනෙකු වැටහීමකින් කරන විශාල පව් කුඩා පව් බවට පත්වන තත්ත්වයකට පත් විය හැකිය. එය කෙසේ වන්නේ නම් කෙනෙකු පවක් කරන විට එය මහා පවක් ලෙස සිතා ලැජ්ජාවට පත්වීම සහ ඒ කෙරෙහි බියෙන් කටයුතු කිරීම නිසා වන්නේය. එසේම ලැජ්ජාවෙන් තොරව එය කිරීම, නොසැළකිල්ල, තුච්ච ලෙස සැළකීම සහ පව් කිරීමේදී බියක් නැතිව කිරීම වැනි හේතූන් මත සමහර විට කුඩා පව් විශාල පව් බවට පත් වන්නේය. එපමණක් නොව, ඒ පව් එයටත් ඉහළ අති භයානක පවක් ලෙසද වන්නට හැකිය.

මෙවැනි පව්හී විවිධ තත්ත්වය සහ අවස්ථාව ක්‍රියාවෙන් එපිට වූ පව් කරන්නාගේ මනෝභාවය සහ චින්තනය

මත රඳා පවතී. එසේම යමෙකු එවැනි විවිධාකාර අවස්ථාව ගැන තමා තුලින්ද පිටස්තරයන්ගෙන්ද මනා අත්දමින් අවබෝධ කර ගන්නේය.

තනිපුද්ගල පව සහ වැරැදීන්හී නපුර

මුහම්මද් නබි (සල්) තුමා මෙසේ විස්තර කළහ : පව සහ දුදන ක්‍රියාවන් මිනිස් සිත් තුල විශාල බලපෑමක් ඇති කරන්නේය. ඒ බලපෑම් ඔවුන් කරන පවෙ සහ නපුරු කමේ තත්ත්වය සහ ප්‍රමාණය මත ශක්තිමත්වී ස්ථීර වන්නේය. තවද පවෙ බුරුල්කම, ලිහිල්කම සහ පව සමාව මත ඒවා බෙලහීන වන්නේය, මන්ද වන්නේය. එහෙයින් කාගේ සිත විකෘතියට පත් කර මතුලොව සිතුවිලි කෙරෙන් ඉවත් කර ආශාව සහ වැරැදි කිරීම මගින් බලපෑම් ඇති කරන්නට නොහැකි වෙදෝ විමුක්තිය සහ ගැලවීම් ලබන්නේ ඔහුය. ඒ ගැන සවිස්තරව අල්ලාහ් දෙව්දූ අල්කුර්ආයේ මෙසේ විස්තර කරයි :

﴿يَوْمَ لا يَنفَعُ مَالٌ وَلا بَنُونَ،إلا مَــنْ أَتَى اللَّهَ بِقَلْبٍ سَلِيمٍ﴾

එදින සේසත්ද, දරුවන්ද කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොදෙන්නේය. අල්ලාහ් වෙත (කුසලෙන් පිරුණු) පිරිසිදු සිතක් ගෙන එන කෙනෙකු විනා (එය අන් අයට අප්‍රයොජනවත් දිනය වෙ).(26 : 88-89)

තවද මුහම්මද් නබි (සල්) තුමා දෙසූ බව අබූහුරෙරා තුමා මෙසේ විස්තර කරයි : සත්‍ය විශ්වාස වන්තයෙකු වරදක් කළේ නම් ඔහුගේ සිතේ කළු පැල්ලමක් හට ගන්නේය. එයින් තමා නිදහස් කර ගැනීම පිණිස පව සමා අයැදු වේ නම් ඒ කළු පැල්ලමක් සිත පිරිසිදු

වන්නේය. එසේ නොවන්නට තවතවත් පාප කර්මයෙහි නියැලෙන්නේ නම් ඒ පැල්ලම අධික වී මහුගේ සිත පමෙන් සත කරවන්නේය. සිත පමෙන් සම්පූර්ණයෙන්ම ඇලී පිරී යන අය ගැන අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආනය තුළින මෙසේ විස්තර කරයි :

﴿كَلَّا بَلْ رَانَ عَلَى قُلُوبِهِم مَّا كَانُوا يَكْسِبُونَ﴾

'නොඑසේය. මවුන් උපයා ගත් දේ මවුන්ගේ සිත්හී (පැල්ලම් සේ) ඇලී ගොස්ය'.(83 : 14)

තවද ඉබ්නු කයියුම් ජවයි තුමා පමෙන් සහ දුදනෙන් ඇති විය හැකි දරුණු විපාකයන් ගැන මෙසේ සටහන් කරයි :

- අකුසලෙහි බැඳෙන්නාට අල්ලාහ් දෙවිඳු සත්‍ය වසන් කර එයට වූ මගද වසන් කරන්නේය.
- සිතේ කාන්තිය අතුරුදහන්වී එහි පමෙ කළුවෙන් පිරී යන්නේය.
- ඥානය සහ ආහාරයේ සවයං බව නැති වන්නේය.
- අල්ලාහ් සහ අනෙකුත් බියබැති අය හා මහුගේ සමීපත්වය සහ සුහදත්වය ඉවත්ව යන්නේය.
- මවුන්ගේ උවමනාවන් පහසුවෙන් සපුරා ගන්නට බැරිව සියල්ල දුෂ්කර වන්නේය.
- මහුගේ සිත සහ කය බෙලහීනයට පත් වන්නේය.
- අල්ලාහ්ට කීකරු වීම හෝ එසේ කිරීමට සිතේ ආශා ඇති වීම හෝ වලකන්නේය.
- ආයුෂ කෙටි වී මරණය යනා කාලයේදී වන්නේය.

- සම්පූර්ණයෙන්ම පවෙ ගිලී යන හෙයින් එහි ඇති පිළිකුල් කම සිතෙන් ඉවත් නොවන්නේය.
- අල්ලාහ්ගේ අනුග්‍රහයෙන් දුරස්ථ වී ඔහුගේ අනුකම්පා සහගත බැල්මෙන්ද ඈත් වන්නේය.
- ඔහු නිහීන බවට පත්වන්නේය.
- ඔහුගෙන් ඥානය ඉවත්වී මුග්ධයෙකු බවට පත් වන්නේය.
- ඔහුගේ සිත පවෙන් කිළිටි වන තුරු ඔහුගේ සිත අගුල් වැටෙන්නේය. ඒ පව මුහම්මද් නබි තුමාගේ ශාපයටද භාජනය වන්නේය. මන්දයත් පව කරන්නන් හට නබි තුමා සාප කර ඇත.
- මුහම්මද් නබි තුමාගේ සුරදූතයන්ගේ පව සමාවෙන් කරුණාවෙන් වලකිනු ලබන්නේය.
- මතුලොව අප්‍රමාණ අඩුවම්වලට භාජනය වන්නේය.
- ඒ පව ගොඩේද, දියමේද, පවනේද, කෘෂි කටයුතු වලද තිවසේද විශාල බලපෑම් ඇති කරන්නේය.
- ඒ පව නිසා භූමි කම්පාවන්, පලි ගැනීම්, වැස්සේද, ඵලදාවෙද, සේසත් වර්ධනයේද අඩුකම ඇති කරන්නේය.
- අකටයුතු වලදී සිතෙන් තරහ ඉවත් කරන්නේය.
- මිනිසෙකුට ස්වභාවිකව පිහිටිය යුතු ලැජ්ජාව සිතෙන් ඉවත් කරන්නේය.
- ඔහු දෙවිඳුගේ මතකයෙන් ඉවත් කර ඒ වෙනුවට ෂයිතාන් සමග සම්බන්ධ වී ඔහු අණපනවන දුදන

කටයුත්තන්හී නියැලී ගැලවීමක් නැති විනාශය වෙත ඇදී යන්නේය.

- යහකම්හී නියලීම සහ යහපත් අය හා ආශ්‍රය කිරීම වැනි කටයුත්තන්ගෙන් ඔහු දුරස්ථ කරන්නේය. ඒ ගැන මුහම්මද් නබි (සල්) තුමා මෙසේ අනතුරු ඇඟවූහ : 'යමෙකු ස්ථිර විශ්වාස වන්තයෙකු ලෙස පසුවන කල හෙතෙම දුරාචාරයෙහි හැසිරෙන්නේ නැත. ඔහු විශ්වාස වන්තයෙකු ලෙස පසුවන කල සුරා පානය කරන්නේ නැත. ඔහු සොරකම් කරන විට විශ්වාස වන්තයෙකු ලෙස පසු වන්නේ නැත'. (මූලාශ්‍රය : බුහාරි සහ මුස්ලිම)
- අල්ලාහ්ගේ අනුග්‍රහයෙන් දුරස්ථ කර ඔහුගේ කෝපයට භාජනය වන්නේය.
- මෙලොවද, එලොවද, මිනිවලේද හිරිහැරයෙන් සහ සන්තාපයෙන් යුත් තත්ත්වයකට පත් වනු ඇත.

ඒ ගැන අල්ලාහ් දෙව්දූ පරිශුද්ධ වූ අල්කුර්ආනයේ මෙස් විස්තර කරයි :

﴿ وَمَنْ أَعْرَضَ عَن ذِكْرِي فَإِنَّ لَهُ مَعِيشَةً ضَنكًا وَنَحْشُرُهُ يَوْمَ الْقِيَامَةِ أَعْمَى ﴾

'ඇත්තෙන්ම යමෙකු මා මෙනෙහි කිරීමෙන් වැළකේද සැබැවින්ම ඔහුට හිරිහැරයෙන් පිරුණු ජීවිතයකි. පරමාන්ත දිනයේ අප ඔහු අන්දයෙකු ලෙස නැගිට එක්රැස් කරමු'.(20 : 124)

- සිතේ චංචලයක් සහ භීතියක් ඇති කරන්නේය.

- මනුට සහ දෙවිඳු අතර විශාල පරතරයක් ඇති කරන්නේය. එසේ පරතරයක් ඇති වන විට යහ කම් කරන මාවතෙන් ඉවත් වී දුදනෙහි යෙදෙන මාවතට පිවිසෙන්නේය.
- ජීවිතය, ඥානය, පෝෂණය, වෘත්තිය සහ අල්ලාහ්ට කීකරුවීම වැන්නෙහි එලොව මොලොව සංවර්ධනය මන්ද කරන්නේය.
- ෂයිතාන්, ආත්මය සහ අනෙකුත් මැවීම් මනුට ආපදාවන් නොකළද දුදනෙහි නියැලීමෙන් ඒ දුදන ක්‍රියාවන් පෙර සඳහන් දේ මගින් මනුට ආපදාවන් විය හැකිය.
- මනුට ලැබිය හැකි සියලු සණයේ අනුග්‍රහයන් මනුට නොලැබී යන්නේය.

ප්‍රසිද්ධ ජන වහරයේ ඇති කවියක් මෙසේ වේ :

අනුග්‍රහයක් මත ඔබ වේ නම් එය මනාව රකිනු මැනවි
හැබැවින් අකුසල් අනුග්‍රහයන් දුරස්ථ කරන ඒවාය
අනවැසියන්ගේ දෙවිඳුගේ බාරය මත ඒවා තබනු මැනවි
මන්දයත් ඒ දෙවිඳු සියල්ලට අඩුවම් දෙන්නේය.

විශ්මිත දේවල්

හිතවත් මුස්ලිම් සහොදයානනි,

ඔබ කෙරෙහි ලියා ඇති අන්දමට යනා කාලයේදී ඔබට විය හැකි මහා විපත ගැන සම්පූර්ණයෙන්ම අමතක කර ඔබලා කම්සැප විඳිමින් සතුටෙන් කෙලි ලොලෙන් පසුවනවාද? ඔබ ඉතා කෙටි කලකින් විඳී මට හැකි මහා රොගය ගැන කිසිදු බියකින් තොරව

ඔබලාගේ ශරීර සෞඛ්‍ය ගැන කිසිදු තැකීමකින් තොරව කටයුතු කරන්නේ මක් නිසාද? ඔබ නොදැනුවත්ව ඔබට යතා කාලයෙදී නින්දනීය වද වේදනාවක් ලගා විය හැකි වග නොදැන ඔබලා ඒවා ගැන අමතක වීමෙන් ප්‍රීතියෙන් කටයුතු කරන්නේ මන්ද? අනෙකා මරණයට පත්වී ඔහු මිනිවල දක්වා ගෙන ගොස් වළලනවා මිසක් ඔබලාද දිනක එවැනි මරණ මොහොතකට පත් වෙනවා යන්න කිසිදු තැකීමකින් තොරව කටයුතු කරන්නේ මන්ද? ඔබලා මෙවැනි අනන්ත අප්‍රමාණ අත්දැකීම්වලට මුහුණ පාන්නට සිදුවන බව සම්පූර්ණයෙන්ම අමතක කර කටයුතු කිරීම ඇත්තෙන්ම විශ්ම ජනක සිදුවීමක් නොවේද?

## මරණයට පෙර පශ්චාත්තාපය

මොලොව මිනිසා කළ පව් සහ දුදන ක්‍රියාවන් කරණය කොට ගෙන අහස වැසි ජලයෙන් වියළී, පොළොව වැස්ස නැතිව නිස්සාරු වී, ජනයන් අතර යහකම් සහ සුභදත්වය අඩුවී, සියල්ලෙහි සමෘධිය සහ අනුග්‍රහය අඩුවී ගොඩෙහිද ජලයෙහිද ව්‍යාති කර්මයන් ව්‍යාප්තවී හුදෙකලා වී ඇත. එවන් ව්‍යාති කර්මයන් නිසා රෝයද දවාලයද නිරතුරුව හඬා වැළපෙන්නේය. එසේ ව්‍යාති කර්මයන් අස්සක් මුල්ලක් පාසා පැතිර ඇති හෙයින් කිරාමන් කාතිබීන් යනුවෙන් හඳුන්වනු ලබන රකීබ් සහ අතීද් වැනි සුර දූතයන් අල්ලාහ් දෙවිඳු වෙත පැමිණිලි කරති. අල්ලාහ්ද ඒ ව්‍යාති කර්මයන්හී නියලී සිටින අය මත නින්දනීය දඬුවම පහළ කරන බව අනතුරු අඟ වන්නේය. සමහරවිට මිනිසුන් නිදහසේ තමා අමතක කර නද නින්දේ පසුවන කල ඒ දඬුවම පහළ කරන බවද පවසයි.

සමහරවිට මවුන් දිවා කාලයේ කෙලි ලොලෙන් ප්‍රීති ප්‍රමෝධව පසුවන කල ඒ අඩුවම පහළ කරන බව පවසයි. තත්ත්වය මෙසේ අනතුරු සහිතව පවතිද්දී එවන් ව්‍යාති කර්මයන්ගෙන් දුදන ක්‍රියාවන්ගෙන් සම්පූර්ණයෙන්ම ඉවත්වී වී පශ්චාත්තාපව අල්ලාහ්ගෙන් පව සමා අයදිය යුතු නොවේද? එ ගැන කරුණාන්විත අල්ලාහ් දෙව්දුම අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿وَتُوبُوا إِلَى اللَّهِ جَمِيعًا أَيُّهَا الْمُؤْمِنُونَ لَعَلَّكُمْ تُفْلِحُونَ﴾

විශ්වාස වන්තයිනි, ඔබලා සියල්ල (සියලු පවෙන් මිදී) ජයග්‍රහකයන් වනු වස් සියලු දෙනාම අල්ලාහ් වෙත පසුතැවිලි වනු මැනව.(24 : 31)

පව සමා අයැදීමේ වැදගත් කම ගැන මුහම්මද් නබි (සල්) තුමා පොදුවෙ මෙසේ විස්තර කළහ :

හිතවත් සහොදරවරුනි, මතු සඳහන් දොළොස් කරුණු ගැන මඳක් සිතා බලන්න. ඔබලා එවායෙන් ඉවත් වන තුරු පව සමා අයැදු කෙනෙකු ලෙස නොවන්නේය.

1. ප්‍රතිසෙෂ්ප කිරීම : ප්‍රතිසෙෂ්ප කිරීම යනුවෙන් සඳහන් කරන විට එය දෙකොටසකට බෙදිය හැකිය. ඒවා විශාල ප්‍රතිසෙෂ්ප කිරීම සහ කුඩා ප්‍රතිසෙෂ්ප කිරීම යනුවෙන් වෙ. කුඩා ප්‍රතිසෙෂ්ප කිරීමෙහි යමෙකු නියලෙන විට එය සදහටම ඔහුට නිරයේ වේදනාම අත්පත් කර නුදුන්නද අල්ලාහ්ගේ මහා නින්දනීය අඩුවම්වලට භාජනය විය හැකිය. විශාල ප්‍රතිසෙෂ්ප කිරීම යනුවෙන් සඳහන් කරන විට එය කෙනෙකු නින්දනීය අන්දමින් සදහටම නිරයේ

පසුවන්නට සළස්වන්නේය. විශාල ප්‍රතික්ෂේප කිරීම පස් ආකාරයට වේ.

- මුසාවාදය මගින් ප්‍රතික්ෂේප කිරීම.
- ආඩම්බරය මගින් ප්‍රතික්ෂේප කිරීම.
- අල්ලාහ්ගේ ඒකීයත්වය සත්‍ය කිරීමෙන් ඉවත් වී කටයුතු කිරීමෙන් ප්‍රතික්ෂේප කිරීම.
- සැක කිරීමෙන් ප්‍රතික්ෂේප කිරීම.
- කුහක කමෙන් ප්‍රතික්ෂේප කිරීම.

2. **ආදේශ කිරීම :** ආදේශ කිරීම විශාල ආදේශ කිරීම සහ කුඩා ආදෙශ කිරීම යනුවෙන් කොටස් දෙකකි වේ. විශාල ආදේශ කිරීමෙහි නිරත වන්නා ඒ වෙනුවෙන් අල්ලාහ්ගෙන් හිතාත්තව පව් සමා නොඅයදින්නට ඒවා කිසිසේත් සමා වනු නොලැබේ. මෙහි විශාල ආදේශ කිරීම යනුවෙන් සඳහන් වන්නේ අල්ලාහ් හා යමෙකු එක් කර වන්දනාමාන කිරීම වේ. එසේ අල්ලාහ් සමග අන් ඒවාද වන්දනාමාන කරන්නා නිහීන තත්ත්වයට පත්ව තම අවසන් සේන්දු වන ස්ථානය දරුණුම නරකාදිය බවට පත් කරගන්නේය.

නවද කුඩා ආදේශ කිරීම යනුවෙන් සඳහන් වන්නේ මුනිච්චාව වේ. මිනිසුන් තමා දෙස බැලිය යුතුය තමා ප්‍රශංසා කළ යුතුය යන චේථනාවෙන් කටයුතු කිරීම වේ. එසේම අල්ලාහ් දෙවිදු මත හැර අන් ඒවා මත දිවරීම, ඔබද අල්ලාහ්ද මනාප වන්නේ නම් යනුවෙන් අල්ලාහ් සාමාණ්‍ය තත්ත්වයකට පත්කර කතා කිරීම, මට ඔබ සහ අල්ලාහ් හැර අන් කිසිවෙකු නැත යනුවෙන්

පුද්ගලයෙකු අල්ලාහ්ගේ තත්ත්වයකට උස් කිරීම, මගේ කටයුත්ත ඔබ වෙත සහ අල්ලාහ් වෙත පවරා ඇත්තෙමි යනුවෙන් පැවසීම වැනි අයුරු වචන පාවිච්චි කිරීම වැන්නන් වෙ. මෙසේ කටයුතු කරන්නා අල්ලාහ් දෙවිඳුගේ විශාල අඩුවමට භාජණය වන අතර හෙතෙම ඉස්ලාමයෙන් පිටවූ කෙනෙකු හැටියට නොසැළකෙයි. ඔහු එයින් මිදීමට නම් පශ්චාත්තාප වී අල්ලාහ්ගෙන් පව් සමා අයදැය යුතුය.

3. කුහක කම : මුනාෆික් හෙවත් කුහක කම විශාල සහ කුඩා යනුවෙන් දෙකොටසකට බෙදිය හැකිය. විශාල කුහකකම යනුවෙන් අර්ථවත් කරන විට කෙනෙකු අල්ලාහ් දෙවිඳු, සුර දූතයන්, ග්‍රන්ථ, වක්තෘවරුන් සහ පරමාන්ත දිනය වැන්නෙහි සම්පූර්ණයෙන්ම විශ්වාස කරන බව මිනිසුන් අතර ප්‍රසාරණය කරගෙන ප්‍රසිද්ධිය නකා ඒ කටයුත්තෙහි නිරත වීමෙන් වළකී සිටීම වෙ. එසේ කටයුතු කරන්නා නිරයේ පතුලෙහිම පසුවන බව ඉස්ලාම් දහම විස්තර කරයි. කුඩා කුහක කම යනුවෙන් පවසන විට හෙතෙම අප පෙර සඳහන් ඒවා විශ්වාස කළද, කතා කරන විට බොරු පවසන්නේය. පොරොන්දුවක් වූ කල කිසිදු පැකිළීමකින් තොරව එය වහා ප්‍රතික්ෂේප කරන්නේය. ප්‍රතිඥාවකට පත්වූවා නම් ඒවා නොබියව කඩ කර කුහකකමෙන් කටයුතු කරන්නේය. මෙසේ කටයුතු කරන්නා නිරන්තරව නිරයට පත් නොවූවද විශාල අඩුවමට භාජණය වන්නේය.

4 නපුරුකම් කිරීම.

5. වැරදි කිරීම.

6 පව් කිරීම.

7. ව්‍යාජ කර්මයෙහි යෙදීම.

8. දුදනෙහි නියැලීම.

9. ප්‍රතික්ෂේප කළ ඒවා කිරීම.

10. දුරාචාරයෙහි හැසිරීම.

11. දැනුමකින් තොරව අල්ලාහ් ගැන හිතුමතේ පැවසීම.

12. බියබැත්තන්ගේ මග හැර අන් අයගේ මග පිළිපැදීම.

## පශ්චාත්තාපවී කඳුළු සැලීම

සමහරු මෙහි මතු සඳහන් කළ ආකාරයට ප්‍රාර්ථනා කරනු අප දැක ඇත්තෙමු. 'මාගේ දෙවියනි, මගේ ආයුෂ කාලය දික් වන්න දික් වන්න මගේ පවද අධික වන්නේය. මා පවෙන් ඉවත් වන්න දුරස්ථ වන්න වෙර දැරූ සෑම මොහොතකම තවත් වරදක් මා වෙත ලඟා වන්නේය'.

දෙවියනි, ඔබගේ විශාල අඩුවමෙන් මා බේරා ගැනීමට හැකි ඔබ හැර අන් කෙනෙකු වේද? මට ඇති එකම පිහිට වන ඔබගේ සම්බන්ධයද පිහිටද විසන්ධි වන කල මට ඇත්තේ කාගේ පිහිටද?

අහෝ දුකකි. මගේ ආයුෂ අධික වන කල මගේ පවද අධික වන්නේය. මගේ පව් අධික නොවී මා ආරක්ෂා ලබන්නේ කවදාද? මා පව් සමාව ලබන්නේ කවදාද? මා දැනදැනද නොදැනද කළ මගේ පව්වලින් මා පවිත්‍ර වන්නේ කවදාද? මා මගේ දෙවිඳු අබියස ලැජ්ජාවීමට අවස්ථාව තවමත් පැමිණියේ නැද්ද?

මා කී වතාවක් වැරැදෙහි සම්බන්ධ වී තිබෙණවාද? ඒවා කොපමණදැයි මම නොදනිමි. මා එසේ වැරැදෙහි බැඳෙන කල මට ඔබ සිහි නොවූයේ මන්ද? දෙවිඳුනි, ඔබ මගෙන් දෘෂ්ටියෙන් ඈත්වී අදෘශමානව සිටියද ඒවා ගැන සදා නිරීක්ෂණය කරමින් පසුවන්නේය. මා පවසන සියළු දේ අසාගෙන සිටින්නේය. සියල්ල අසන්නාද නිරීක්ෂණය කරන්නාද ඔබ වෙ. මා මෙයට පෙර කළ පව ගැන සිතාන්තව සිතා පශ්චාත්තාපවී ශ්‍රද්ධාවන්තව දුක් කඳුළු සළමි. ඒ පවෙන් මිදෙන්නට ඔබගෙන් සිතාන්තව පව සමා අයැදිමි.

## සිත පවිත්‍ර වීම

හිතවත, අපගේ සිත් පවෙන් ඉවත්වීම පිණිස පිරිසිදු වන්නට නම් අප මතු සඳහන් කරන කරුණු පහෙන් ඉඳුරාම ඉවත් වී කටයුතු කළ යුතුය. එසේ ඉවත් වීමෙන් විනා අප සිත කිසිවිටෙක පවිත්‍ර වීමට අවස්ථා වක් නොවන්නේය. ඒ කරුණු පහ මෙසේය:

- අල්ලාහ්ගේ ඒකේශ්වර වාද සංකල්පයය විනාශ කරන අදේශ කිරීම.
- වක්තෘ මුහම්මද් නබි (සල්) තුමාගේ මග පෙන්වී මට පටහැනිව ඉස්ලාමය තුලට ඈතුල් වූ නූතන බිද්ආහ් නිරත වීම.
- ආශාවන් හට පිටුපා සිතට වහල් වීම.
- දික්ර් වැනි අල්ලාහ් මෙනෙහි කිරීමේ කටයුතුවලින් ඉවත් වී සිටීම.
- ඒකේශ්වර වාදයට සහ අවංකත්වයට විරුද්ධ වන අයුරු සිතට වහල්වී කටයුතු කිරීම.

ඉහත සඳහන් කළ කරුණු පහ කෙනෙකු අල්ලාහ් දෙවිඳුගෙන් ඈත්වීමට මං පාදා දෙන්නේය. මහුගේ සිත බෙලහීනයට පත් කර එසේම මහුගේ සිත සම්පූර්ණ යෙන්ම විකෘතියට පත් කර පලි ගැනීම, චරිතය ලක්ෂණ සහ ගුණ යහපත් කම් වෙනස් වීම වැනි විවිධ දුර්ගුණ යන් මත ක්‍රියා කරන්නට සළස්වන අතර මහුගේ පව් සමා අයැදීමේ දොරටුවටද මුළුමනින්ම අගුල් වැටෙන්නේය.

පව් සහ දුදන මාර්ගෙන් ඉවත් වීමට සමහර අවවාද:

- අප වරදක බැඳෙන කල අල්ලාහ් අප කෙරෙහි අවධානමෙන් සිටී යන්න අමතක නොකළ යුතුය.
- අල්ලාහ් කෙරෙහි ප්‍රිය මනාප වීම. අල්ලාහ් කෙරෙහි ප්‍රිය වන කල මහු විසින් තහනම් කළ දේ කෙරෙහි කටයුතු කිරීමට සිත ඉඩ නොදෙන්නේය.
- තමාට අල්ලාහ් විසින් පිරිනමා ඇති අනුග්‍රහයන් ගැන මදක් මෙනෙහි කළ යුතුය. එසේ මෙනෙහි කරන විට අනුග්‍රයක් දැක්වූ මහුට පිටුපා කටයුතු කිරීමට කිසිවිටෙක මිනිස් සිත ඉඩ නොදෙන්නේය.
- දුදනෙහි යෙදෙන කල අල්ලාහ් දෙවිඳුගේ කෝපය සහ මහුගේ දරුණු දඬුවම ගැන මදක් සිතා බැලීම. මන්දයත් මිනිසා දුදනෙහි බැඳෙන සෑම මොහොතකම අල්ලාහ් උරණ වන්නේය. ඒ දුදන ක්‍රියාවන් වෙනුවෙන් කුමන අන්දමින් දඬුවම් සූදානම් කර ඇත්දැයි සිතා බලන විට එසේ දුදන ක්‍රියාවෙහි යෙදීමෙන් අප ඉවත් වී එයින් ආරක්ෂා විය හැකිය.

- වරදෙහි නියළීමෙන් කොපමණ කුසල් මෙලොවෙහි සහ මතුලොවෙහි අප කෙරෙන් ඉවත වන බව මදක් සිතා බැලීම.
- ෂයිතාන්ගේ අණවලට අවනත නොවී සිතට වහල් නොවී එයින් ජය ගැනීම.
- අල්ලාහ් සැමවිටම අප සමග පසුවන බවත් අපගේ සියළු කටයුත්තත් නිරීක්ෂණය කරමින් පසුවන බවත් මතක් කර ගත යුතුව ඇත. ඒ ගැන අල්ලාහ් දෙව්දූම පරිශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿إِنَّ اللَّهَ مَعَ الَّذِينَ اتَّقَواْ وَّالَّذِينَ هُم مُّحْسِنُونَ﴾

ඇත්තෙන්ම බියබැතියෙන් පසුවන්නේ කවරෙක් ද අල්ලාහ්, ඔවුන් සමගද, යහකම් කරන්නේ කවරෙක්ද ඔහුන් සමගද පසුවන්නේය.(16 : 128)

- අපට නොදැනී ඕනෑම මොහොතක ඇති විය හැකි ක්ෂණික මරණය ගැන බියවිය යුතුය.
- දුක් කරදර ගැන සිතා ඒ ගැන බියවීම. මන්දයත් ඇතිවන දුක්කරදර කවදත් අඩුවමක් ලෙස පවතින බව වටහා ගත යුතුය. සතුට සහ සන්සුන යහකම් වෙනුවෙන්වූ ඵලවිපාක බව මතක තබා ගත යුතුය.
- සිතට වහල්වී කටයුතු කිරීමට සිත උනන්දු කරන විට දහම අනුමත කළ කටයුත්තන්හී නියළී සිතට වහල්වීමේ කටයුත්තන් හට විරුද්ධව කටයුතු කර සිතට වහල් වීමෙන් ඉවත් වීම.

- තම ආත්මය සිතට වහල් වන ලෙස උනන්දු කරන විට එය දමනය කර ගත යුතුය.

- සිතට වහල්වීමට උනන්දු කරන කටයුතුවලින් ඉඳුරාම ඉවත් වී සිටීම.

- තම චින්තනය අල්ලාහ්ගේ විශ්මිත නිර්මාණයන් ගැන සිතා බැලීමෙහි යෙදීම.

- මෙම ලොව හැකි ඉක්මණින් කවදා හෝ විනාශ වන බව නිතර නිතර මතකට ගෙන ආ යුතුය.

- ප්‍රාර්ථනාවන් අනුමත වන වේලාවන්හී පිරිසිදු චේථනාවෙන් ප්‍රාර්ථනාවෙහි යෙදීම.

- තමා උසස් තත්ත්වයක පත්වීමට හැකි බව හෝ නිහීන තත්ත්වයට පත් විය හැකි බව හෝ නිතර නිතර මතක් කර ගත යුතුය.

- තම සිත සහ කය සියළු අකුසලෙන් පවිත්‍ර කර තබා ගත යුතුය. එවිට අල්ලාහ්ගේ ශාන්තිය පහසුවෙන් අප වෙත ලියවෙන්නට හැකි වනු ඇත.

- දුදනෙහි පිළිකුල සහ එහි අවසන් විපාකය හෝ නපුර දැන ගෙන සිටිය යුතු අතර අල්ලාහ් යමක් කිරීමට අණ පනවා ඇත්නම් එහි යහපතක් ඇති බවත්, යමක් තහනම් කර ඇත්නම් එහි අයහපතක් සහ දොලොවම ජයක් ඇති බවත් වටහා ගත යුතුය.

- තමාට උවමනා යමක් ලබා ගැනීමට ඒ ගැන දැන ගෙන සිටීම පමණක් ප්‍රමාණවත් නොවන බව වටහා ගෙන එය ලබා ගන්නටනද එහි දියුණුවක් ඇති වන්නටද කටයුතු කළ යුතුව ඇති බවත් වටහා ගත යුතුය.

- අල්ලාහ් දෙවිඳු අප කරන සෑම කටයුත්තක්ම සැමවිටම අප අවධානය කරමින් නිරීක්ෂණය කරමින් සිටී යන්න වටහා ගත යුතුය. යමෙකු ඒ ගැන මනාව වටහා ගන්නේද එවිට හෙතෙම අල්ලාහ්ට අකීකරු වීමෙන් තමා ආරක්ෂා කර ගන්නේය.

- සෑම මොහොතකම අල්ලාහ් දෙවිඳුට බියවීමෙන් වැරැද්ද කිරීමෙන් ඈත් වන්නේය.

- සිතේ මහිමය, එහි පිරිසිදුව සහ එහි ශක්තිය මනාව වටහා ගෙන එය කෙසේ දමනය කර යටත් කර තම පාලනය යටතට ගෙන ආ හැකිද යන කරුණු මනාව වටහා ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

- ආහාරය, පානය, ඇඳුම්පැළඳුම් සහ නින්ද වැනි කටයුත්තන්හී නුවුවමනා අන්දමින් නිරත නොවී සිටිය යුතු අතර, නුවුවමනා අන්දමින් මිනිසුන් සමග අනිවාර්යතේ කාලය කා දැමීමෙන් වැලකී කටයුතු කරන විට සිත සහ කය පිරිසිදු වන්නේය.

- දහම කෙරෙහි වූ සම්පූර්ණ විශ්වාසය සිතේ මුල් බැස ගන්නට සැලැස්විය යුතුය. එසේ කිරීමෙන් එහි ශක්තිය සහ ශ්‍රධාවන්තභාවය නපුරුකම් සහ පාප

කර්මයන් තමා වෙත ලඟාවීමෙන් වළක්වා ගත හැකි වන්නේය. එසේම එය ස්ථිරව පසුවන කාලයක් කාලයක් පාසාම මිනිසා දුදනෙහි නිරත වීමෙන් තමා ආරක්‍ෂා කර ගන්නේය. ඒ ස්ථිර විශ්වාස බෙලහීන වන්නට මහුගේ ඉවසුමද බෙලහීනයට පත් වන්නේය.

පව් කාරයන් ගැන ඉබ්නු අබ්බාස් තුමා මෙසේ පවසයි : පාපයේ නිරතව පසුවන්නනි, ඔබගේ අවසානය ඉතා දුක්බර එකක් බව කිසිසේත් අමතක නොකරනු. ඔබ පාප කර්මයන් නොකඩවා කර ගෙන යන විට එය විශාල පාපයන් බවට පත්වන්නේය.

- මබ පාපයේ වරදෙහි බැඳෙන විට ඔබ අභියස ඇති තැනැත්තන් බලා ඔබ ලැජ්ජාවට නොපත්වන්නේ නම් එයද විශාල පාපයකි.
- ඔබ දැනගෙන හෝ නොදැන හෝ වරදක් කර ඒ ගැන සිතාසෙන විට අල්ලාහ් දෙවිඳු ඔබට දීමට බලාපොරොත්තු වන විශාල අඩුවම ගැන මෙනෙහි නොකරන්නේ නම් එයද විශාල පාපයකි.
- ඔබ වරදක් කර ඔබ ජයග්‍රහණයට පත්ව ඇති බව සිතන්නේ නම් එයද විශාල පාපයකි.
- ඔබ පවෙහි නිරත වන විට ඔබගේ දොරටුවට දමා ඇති තිරය සෙලවෙන කල එයට ඔබ බිය වන්නේ නම් එයද විශාල පාපයකි.
- ඔබ පවෙහි නිරතව සිටින විට ඒවා ගැන අල්ලාහ් දෙවිඳු ඔබ නිරීක්‍ෂණය කරගෙන සිටී යනුවෙන් ඔබ

බිය නොවී කැටයුතු කරන්නේ නම් එයද විශාල පාපයකි.

## නිෂ්ඵල පසුතැවිල්ල

තමා නොසැළකිල්ලෙන් අනිවාර්තේ ගෙවා දැමූ තරුණ කාලය ගැන දුක් වන කෙනෙකුගේ අඳොනාව කවි යෙකු මෙසේ විස්තර කරයි :

මගේ තාරුණ්‍යය ගැන මා හඬා වැලපෙන්නෙකි
නමුදු අඳොනාව කිසිදු ඵලක් ගෙන නොදෙන්නේය
අහෝ මගේ තාරුණ්‍යය කෙරෙහි වූ දුකකි
සුදු හිසකේ හා මහලුකම යෞවනයේ විශේව හඟවයි

කොල ඉවත ලා දණ්ඩ පමණක් ගත් ලෙසද
තරුණ ශාඛාවක් වූ මා එයින් ගලවන ලද්දේද
මගේ තාරුණ්‍ය දිනක මා වෙත ආපසු නොඒද
මේ මහලුවිය කළ සියල්ල එයට පහදා දෙන්නේද?

## පාප කර්මයට දෛවය සාධක කරගැනීම

හිතවත,

බොහෝ දෙනෙකු තමන් කරන වැරැදි වලට අල්ලාහ් දෙවිදුගේ දෛවය සහ පෙරමිනුව හේතුවක් ලෙස පෙන්වති. ඒ ගැන මවුන් මෙසේ පුහුවදන් දොඩති. අල්ලාහ් මා මවන්නට පෙරම මගේ වැරැදි සහ පව් නිර්මාණය කර ඒවා ලියා තබා ඇත. ඒවා අහස සහ මහපොළොව නිර්මාණය කරන්නට පෙරම නිර්මාණය කර ඇත. කරුණු එසේ වෙද්දී කෙසේ ඒ පව් සහ වැරැදිවලින් මා බේරා ගන්නද? මුදවා ගන්නද? මහු නිර්මාණය කළ ඒ පව් වෙනුවෙන් මා අඬුවමට භාජනය කරන්නේ කෙසේද? මහුගේ මෙම පුහුවදන්

අල්කුර්ආනය තරයේ හෙළා දකී. එසේම ඒවා එත්තු ගන්වන්නට මහුට කිසිදු සාධකයක්ද නැත.

තවද ඒ පුහුවාදයට, කුතර්කයට උත්තරය වශයෙන් සුප්‍රසිද්ධ විද්වතෙකු වන සාලිහ් අල් උමෛදමීන් තුමා මෙසේ කරුණු පැහැදිලි කරයි : අල්ලාහ් තමා විසින් නිර්මාණය කර ඇති වැරැදි වෙනුවෙන් මහු කෙසේ අඩුවම් පමුණුවිය හැකිදැයි යමෙක් විමසන විට ඔබ මෙසේද විමසිය යුතුව ඇත. මිනිසා යහකර්මයන් කරන විට ඒ වෙනුවෙන් සුවිපාක ලබන්නේය. එයද මහු විසින් පෙරම සටහන් කර තබා ඇති කල ඒවාට කෙසේ සුවිපාක ලැබෙනවාදැයි විමසිය යුතුය. එහෙයින් වරදෙහිද යහකර්මයෙහිද අල්ලාහ්ගේ පෙර නිතුම සාදකයක් ලෙස ගෙන හැර පෑමට නොහැකිය.

එයට තවත් පිළිතුරක් මෙසේය : ඒ අදහස අල්කුර්ආනයම ප්‍රතික්ෂේප කර විස්තර කරන අතර ඔබලාට දැනුමක් නැති දේහී නිරත වීමේ වරදට ඔබලා භාජනය විය හැකිය. ඒ ගැන අල්ලාහ් පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿سَيَقُولُ الَّذِينَ أَشْرَكُواْ لَوْ شَاء اللّهُ مَا أَشْرَكْنَا وَلاَ آبَاؤُنَا وَلاَ حَرَّمْنَا مِن شَيْءٍ كَذَلِكَ كَذَّبَ الَّذِينَ مِن قَبْلِهِم حَتَّى ذَاقُواْ بَأْسَنَا قُلْ هَلْ عِندَكُم مِّنْ عِلْمٍ فَتُخْرِجُوهُ لَنَا إِن تَتَّبِعُونَ إِلاَّ الظَّنَّ وَإِنْ أَنتُمْ إَلاَّ تَخْرُصُونَ﴾

'අල්ලාහ් මනාපය වී නම් අපද අපගේ පියවරුද කිසිදු සමානයක් නොතැබුවෙමු යැයිද කිසි දෙයක් තහනම්

නොකළෙමු යැයිද (අල්ලාහ්) ආදේශයන් තැබූ අය පවසති. එසේම මොවුන්ට පෙර විසූ අයද තම දඬුවම විඳින තුරු (වක්තෘ වරුන්) බොරු කරමින් පසුවූහ. එහෙයින් ඔබ මෙයට සාධකයන් තිබෙණවාද යනුවෙන් (ඔවුන්ගෙන්) අසනු මැනව. වේ නම් එය අපට එළි කරන්න. ඔබලා (ඔබගේ මනස්ගාත සිතුවිලි) හැර අන් කිසිවක් අනුගමණය නොකරන්නෙහුය. ඔබලා අනුමාණ කරන්නන් මිස නැත යනුවෙන් (නබි තුමනි) ඔවුන් සමග පවසනු මැනව'. (6 : 148)

ඉහත විස්තර කරන ලද අල්කුර්ආන් වැකියේ සඳහන් වන අයුරෙන් පෙර දවසක සමාජයක් ජීවත් වූ බවත්, ඔවුන් නොකඩවා මෙසේ පවසමින් පාප කර්මයෙහිද නිරතව සිටි හෙයින් අල්ලාහ් දෙවිඳු ඒ සමාජය විශාල දඬුවම් දී විනාශ කළ බවත් සුපැහැදිලිය. ඔවුන් පැවසූ ඒ අදහස නිවැරැදි නම් අල්ලාහ් දෙවිඳු ඒ සමාජය විනාශ කරන්නට උවමනා නැති බව මනාව වටහා ගත යුතුය. එපමණක් නොවෙයි. ඒ සමාජ වැසියන් අමතා ඔබලා පවසන්නේ මුසාවාදයක් නොවේ නම් එයට සාධක වේ නම් ගෙන එන්න යනුවෙන්ද තම කීකරු අනවැසියා මුහම්මද් නබි තුමා මගින් අභියෝග කර ඇත. නමුදු එයට කිසිදු සාධකයක් ඔවුන් වෙත නොවිය.

අනෙක් උත්තරය : අල්ලාහ් විසින් ලියා තබා ඇති පෙරමිනුම ඔහු පමණක් දන්නා කරුණකි. ඒ ගැන අන් කිසිවෙකු නොදනී. තමාට මෙවන් දෙයකට මුහුණ දීමට සිදුවී ඇති බව මිනිසා දන්නේ හෙතෙම එවන් අත්දැකීමකට පත්වූ පසුවයි. සත්‍ය මෙසේ වෙද්දී මෙය මගේ පෙරමිනුම මත ලියා ඇති පාප කර්මයන්, එය මට කළ හැකිය යනුවෙන් කෙනෙකු පවසා හෙතෙම

කෙසේ පාප කර්මයේ නියැළෙන්නද? සමහරවිට ඒ පව් වෙනුවෙන් ඔහුට පිනක් ද ලියා තිබෙන්නට හැකිය. ඒ ගැන මොහු දැන ගන්නේ කෙසේද? එහෙයින් පවක් කරනවාට ඒ වෙනුවෙන් හොඳක් කිරීමට වෙර දරා අල්ලාහ් පෙරමිනුමක් ලෙස මා කෙරෙහි මෙසේ ලියා ඇත යනුවෙන් ඔහුට කිමට හැකි නොවේද?

තවත් උත්තරයක් : අල්ලාහ් දෙවිඳු මිනිසාට මනා චින්තනා ශක්තියක් සහ ඥානයක් ලබා දී ඇති අතර ඔහුගේ සත්‍ය වදන වන අල්කුර්ආනයද පහළ කර එය මනාව වටහා ගැනීමට වක්තෘ වරයෙකුද පිටත් කළේය. එසේම සත්‍ය සහ අසත්‍ය ගැන මනාව පහදා දී මෙය කළ යුතුද නොකළ යුතුද යනුවෙන් තොරා බේරා ගැනීමේ දැනුමද ලබා දුන්නේය. මෙසේ සියළු දේ පහසු කර දී ඇති හෙයින් කුසල් කර්මයන් ගැන වටහා ගෙන කිරීම වෙනුවට අකුසල් කර්මයන් සහ පාප කර්මයන් පමණක් තොරා ගන්නේ මන්ද?

උදාහරණයවක් වශයෙන් කෙනෙකු ගමනක් පිටත් වෙද්දී ඔහුට ඔහු ගමන් කිරීමට තීරණය කර ඇති මාවත් දෙකක් තිබී එයින් එකක් ආරක්ෂා සහිතවද අනෙක අකටයුතු සහ භීතියෙන් පිරී අනාරක්ෂිත එකක් වෙද්දී ඔහු තොරා ගන්නේ ආරක්ෂිත මග බව පැහැදිලිය. ලෞකික කටයුතුවලදී මෙසේ වෙද්දී අල්ලාහ් ඔහු වෙනුවෙන් හොඳ සහ නරක දෙකම ලියා තිබෙද්දී හෙතෙම නරක දේවල් අත් හැර හොඳ දෙවල් පමණක් ලබා ගැනීමට උත්සාහ නොකරන්නේ මන්ද? එසේ නොවන්නට අල්ලාහ් මා නපුරුකම් කිරීමට මගේ පෙර මිනුම ලියා ඇත යනුවෙන් පවසන්නට නම් ඔහු මුග්ධයෙකු මන්ද බුද්ධිකයෙකු මිස අන් කවරෙක්ද?

තවද යහකර්මයන් වෙනුවෙන් වූ මාවතක්ද අයහකර්මයන් වෙනුවෙන් වූ මාවතක්ද එක සමානව අප ඉදිරියෙහි වේ. එහෙයින් යමෙකු අල්ලාහ් අයහපත් මාවත තමාට ලියා තබා ඇත යනුවෙන් පවසමින් ඒ මග ඔස්සේ පමණක් ගොස් දුදනෙහි නිරත නොවී යහපත් මග ඔස්සේ යෑමට තීරණය කර ගත යුතුය.

එසේම මුදල් හදල් හම්බ කිරීම වැනි කටයුත්තන්හී අල්ලාහ් දෙනු ඇත, ඔහු විසින් පෙරමිනුම ලෙස ලියා තබා ඇති දේ ලැබෙනු ඇත යනුවෙන් තම නිවසට වී පසුවන කිසිවෙකු දැක ගත නොහැකිය. වෙනුවට කුමණ ආකාරයකින් මුදල්හදල් උපයා තම උවමනාවන් සපුරා ගත හැකිදෝ ඒ මාර්ගය ඔස්සේ නොපමාව කටයුතු කරනු ඇත.

එහෙයින් ලෞකික සැප සම්පත් සෙවීමේදීද අල්ලාහ්ට කීකරු වීමෙහිද කටයුතු කරන්නට අධිෂ්ටානය කරන්නාට කුමණ වෙනසක් වේද? අල්ලාහ්ට අකීකරු වී අයහපත් කර්මයන් කිරීම කෙරෙහි පමණක් අල්ලාහ් විසින් ලියා තබා ඇති පෙරමිනුම සාධකයක් ලෙස පෙන්වන්නට උත්සුක වන්නේ මන්ද? ලෞකික කටයුත්තන්හී අප කිසිවිටෙක පෙරමිනුමක් ගැන නොසිතා කුමණ අන්දමින් සේසත් එකතු කිරීමටද හැකිදෝ ඒ මග ඔස්සේ අතපසු නොවී පියාඹා යන්නෙමු. මෙයින් වැටහී යන්නේ මිනිසා සිතට වහල් වීම ඔහු අන්ධයෙකු ගොළුවෙකු අන්දමින් අයහපත් කර්මයන්හී නිරත වීමට සළස් වන බවය.

තවද එතුමා මෙසේද විස්තර කරයි :
පාප කර්මයන්හී නිරත වන්නා ඔහු කරන පාපකර්ම යන් වෙනුවෙන් අල්ලාහ් විසින් ලියා තබා ඇති පෙර මිනුම සාධකයක් ලෙස පෙන්වන්නට නොහැකිය. මන්ද යත් පාප කර්මයෙහි නියලෙන්නා තමා මත ඒ පාප කර්මය ලියා තබා තිබෙණවාද? යන දැනුමකින් තොරව ඔහු එහි නිරත වන්නේය. එහෙයින් ඔහු මත කුමක් පෙරමිනුමක් ලෙස ලියා තිබේද එය සිදුවූ පසුව හෙතෙම ඒ ගැන දැනගන්නවා විනා ඒ ගැන පෙර දැනුමක් ඔහුට කිසිවිටෙක නොවේ. ඒ ගැන අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අලකුර්ආයේ මෙසේ විස්තර කරයි :

﴿ وَمَا تَدْرِي نَفْسٌ مَّاذَا تَكْسِبُ غَدًا ﴾

හෙට දින තමා (කරන්නේ) උපයන්නේ කුමක්ද යන්න කිසිවෙකු නොදනී. (31 : 43)
එහෙයින් ඔහු කිරීමට පෙරටු වන පින හෝ පාපය එය කළ පසු මිස පෙර කිසිසේත් ඒ ගැන හැඟීමක් නැති කල ඔහු කෙසේ පෙරමිනුම සාධකයක් ලෙස පෙන්වන්නද? මිනිසා මෙසේ දැනුමකින් තොර පෙර මිනුම සාධකයක් ලෙස පෙන්වන්නට උත්සාහ කිරීම වැරැදි බව අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආයේ මෙසේ විස්තර කරයි :

﴿سَيَقُولُ الَّذِينَ أَشْرَكُواْ لَوْ شَاء اللّهُ مَا أَشْرَكْنَا وَلاَ آبَاؤُنَا وَلاَ حَرَّمْنَا مِن شَيْءٍ كَذَلِكَ كَذَّبَ الَّذِينَ مِن قَبْلِهِم حَتَّى ذَاقُواْ بَأْسَنَا قُلْ هَلْ عِندَكُم مِّنْ عِلْمٍ فَتُخْرِجُوهُ لَنَا إِن تَتَّبِعُونَ إِلاَّ الظَّنَّ وَإِنْ أَنتُمْ إَلاَّ تَخْرُصُونَ﴾

අල්ලාහ් මනාපය වී නම් අපද අපගේ පියවරුද කිසිඳු සමානයක් නොතැබුවෙමු යැයිද කිසි දෙයක් තහනම් නොකළෙමු යැයිද (අල්ලාහ්) ආදේශයන් තැබූ අය පවසති. එසේම මොවුන්ට පෙර විසූ අයද තම අඩුවම විඳින තුරු (වක්තෘ වරුන්) බොරු කරමින් පසුවූහ. එහෙයින් ඔබ මෙයට සාධකයන් වේද යනුවෙන් (ඔවුන්ගෙන්) අසනු මැනව. වේ නම් එය අපට එළි කරන්න. ඔබලා (ඔබගේ මනස්ගාත සිතුවිලි) හැර අන් කිසිවක් අනුග මණය නොකරන්නෙහුය. ඔබලා අනුමාණ කරන්නන් මිස නැත. යනුවෙන් නබි තුමනි ඔවුන් සමග පවසනු මැනව. (6 : 148)

තවද පාපකර්මයෙහි නිරත වන්නට පෙරමිනුම සාධක යක් ලෙස පෙන්වන්නට උත්සාහ කරන්නාට අප මෙසේද වටහා දෙන්නට බලාපොරොත්තු වෙමු. යහකර්මයන්ද ලියා ඇත්තේ අල්ලාහ් දෙවිඳු විසිනි. එහෙයින් යහකර්ම යන් කිරීමට තම සිත යොමු කිරීම උත්සාහ නොකරන්නේ මන්ද? මන්දයත් යහකර්ම සහ අයහකර්ම කුමක් පෙර මිනුමක් ලෙස ලියා තිබුණද, එය කළායින් පසු මිස එයට පෙර මට ලියා ඇත්තේ මෙය යැයි කිසිවෙකුට පැවසීමට නොහැකිය. ඒ ගැන මුහම්මද් නබි (සල්) තුමා තම කලණ මිතුරන් අමතා 'ඔබලාට අයත් ස්ථානය අල්ලාහ් ස්වර්ගයද නොවන්නට නරකාදියද යන්න තීරණය කර ඇත' යනුවෙන් දෙසූ විට වහා කලණ මිතුරන් 'එසේනම් අප කුසල් කර්මයන් කිරීමෙන් වළකී සිටින්නට හැකි නොවේද'යි විමසන්නට වූහ. එයට මුහම්මද් නබි (සල්) තුමා 'නැත, ඔබලා නොකඩවා කටයුතු කරන්න. හැමදෙනාම කුමක් කිරීම

පිණිස නිර්මාණය වීදෝ මහුට එයට පහසු කර දී ඇත' යනුවෙන් පිළිවදන් දුන්හ.

තවද එසේ පවසන්නන් හට මෙසේ කියන්නට කැමැත්තෙමු. ඔබ මක්කාවට යන්න සූදානම් වනවා යැයි සිතමු. එහි යැමට මාවත් දෙකක් වේ. එහි යැම ආරක්ෂිත සහ අනාරක්ෂිත මාවත් දෙකක් වන කළ ඔබ සතුටෙන් තෝරා ගන්නේ ආරක්ෂා සහිත මාවත නොවේද? එසේ වෙද්දී ඔබ අනාරක්ෂිත මාවත තෝරා ගන්නා නම් ඔබ කුමණ මාදිලියේ පුද්ගලයෙක්ද? තවද ඔබ රැකියා දෙකක් වෙනුවෙන් තෝරී පත්වී එයින් එකක් අඩු වැටුපක්ද අනෙක වැඩි වැටුපක්ද වේ නම් ඔබ අඩු වැටුප් රැකියාව තෝරා ගන්නවාද? තත්ත්වය මෙසේ වෙද්දී ඔබ විනාශ මුඛයට ඇද ගෙන යා හැකි පාප කර්මයන්හී නිරත වන්නට අල්ලාහ්ගේ පෙරම්නුම සාධකයක් ලෙස පවසන්නේ කෙසේද?

තවද ඔබ රෝගාතුර වී ඒ වෙනුවෙන් ප්‍රතිකාර පිණිස වෛද්‍ය වරු වෙත යන්නේය. එසේම ඒ රෝගය හැකි ඉක්මණින් සුව කර ගැනීම පිණිස ඔබට ඇති වන කැක්කුම් සහ වේදනාවන් ඔබ ඉවසා ගන්නා අතර ඒ වෙනුවෙන් ලබා දෙන බොහෙත් තිත්ත වුවද එය භාවිතා කරන්නේය. ඔබ ඔබට වැළඳී ඇති ලෙඩ සනීප කර ගැනීම පිණිස ඔබ මෙසේ කටයුතු කරන්නේය. එසේ නම් ඔබගේ සිත පාප කර්මය නම් රෝගයෙන් පීඩිත වන හෙයින් එයට ප්‍රතිකාර ගැනීමට උත්සාහ කළ යුතු නොවේද?

තවද අයහපත් ක්‍රියාවන් සියල්ල අල්ලාහ් වෙතින්ම පැමිණෙන බව කීමටද අප සූදානම් නැත. මන්ද යත්

අල්ලාහ් දෙවිඳු අති කරුණාවන්තයාය. දයාන්විතයාය. ඥාන වන්තයාය. මුහම්මද් නබි තුමා වරෙක දෙසූහ : 'දෙවියනි, දුදන ක්‍රියාවෙන් ඔබට අයත් ඒවා නොවෙ'. තවද අල්ලාහ් දෙවිඳුගේ පෙරමිනුම ගැන සිතා බලන විට එහි කිසිදු නපුරක් වීමට නොහැකිය. මන්දයත් ඒවා සියල්ල ඔහුගේ ඥානයෙන් අනුග්‍රහයෙන් සකස් කළ ඒවා වෙ. නමදු ඔහු විසින් සම්පාදන කරන ලද ඒවායේ සමහරෙක පමණක් අයහපතක් දැකිය හැකිය. එහෙයින් මුහම්මද් නබි තුමා හසන් බින් අලි තුමාට ඉගැන්වූ කුනූතය මෙසේ විස්තර වෙ : 'දෙවියනි, ඔබ විසින් සම්පාදන කරන ලද අයහපතෙන් මා ආරක්ෂා කරනු මැනව'. එහෙයින් අල්ලාහ් විසින් සම්පාදනය කරන ලද ඒවාහී අයහපත් ඇති බව මුහම්මද් නබි තුමා පෙන්වා දී ඇත. අල්ලාහ් එසේ අයහපතක් සූදානම් කර තිබුණද, එය සම්පූර්ණයෙන්ම අයහපතක් ලෙස පිළි ගැනීමට නොහැකිය. මන්දයත් එය එක් ක්‍රමයකින් අයහපතක් වූවද තවත් අන්දමින් එය යහපතක් ලෙසද විය හැකිය. ලොවෙ පවතින නද ඉඩෝරය, ලෙඩරෝග බිය සහ දුප්පත්කම වැනි සියල්ල අයහපත් ඒවා වුවද ඒවා අනෙක් අතකින් යහපත් ඒවා යන්න පැහැදිලි වනු ඇත. ඒ ගැන අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿ظَهَـــرَ الْفَسَـــادُ فِي الْبَرِّ وَالْبَحْرِ بِمَا كَسَبَتْ أَيْدِي النَّاسِ لِيُذِيقَهُم بَعْضَ الَّذِي عَمِلُوا لَعَلَّهُمْ يَرْجِعُونَ﴾

මිනිසුන් දැතෙන් සපයා ගත් (දුදන) දැය කරණ කොට ගෙන ගොඩෙහිද දියෙහිද දුදන (සහ පීඩා) ඇති විය.

(දුදනන්) මවුන් (සුමගට) හැරෙනු වස් මවුන් කළ (දුදන) ඒවායෙන් සමහරක් (මෙලොවෙහිද) විඳවන්නට සළස්වන්නේය.(30 : 41)

සොරකම් කළ පුද්ගලයාගේ අත සිඳලීමද, දුරාචාරයේ නිරත වන්නාට මැරෙණ තුරු ගල් ගැසීමද මහු මහුටම කර ගත් දුදන ක්‍රියාවන් ලෙස කිව හැකිය. නමුදු මෙහෙතම එසේ අයහපතෙහි නොතියළී සිටීම දෙලොව අඩුවමෙන්ම බේරී සිටීමට සළස්වන අතර මහු ආරක්‍ෂා ලැබීමට මං පාදා දෙන්නේය. එසේම කළ දුදන ක්‍රියාවට අඩුවම් දීමේදී අනෙක් අයද මෙවන් දුදනෙහි නිරත වීමෙන් තමන් ආරක්‍ෂා කර ගන්නට කධිම අවස්ථාවක් වන්නේය. එසේම මිනිසාගේ ජීවිතයද ධේසතද මහුගේ චරිතයද ආරක්‍ෂා වන්නේය.

පාප කර්මයෙහි නිරත වීමෙන් ඉවත් වන විට ඇති වන ප්‍රගතියන් මෙසේ විශාරද ඉබ්නු කයියූම් ජව්සි තුමා මෙසේ විස්තර කරයි :

- මිනිසත්වය ආරක්‍ෂා වන්නේය.
- චරිතය ආරක්‍ෂා වන්නේය.
- ගෞරවය ආරක්‍ෂා වන්නේය.
- ධේසත් ආරක්‍ෂා වන්නේය.
- යහපත් සමාජ සම්බන්ධය ඇති වන්නේය.
- ජීවිතය සමෘධිමත් වන්නේයව.
- කය සන්සුන් වන්නේය.
- සිත එඩිතර වන්නේය.
- සිත පිරිසිදු වන්නේය.

- සිත පුළුල් වන්නේය.
- සිත ගෝචරයට පත් වන්නේය.
- දුදනන්ගේ බියෙන් ඉවත් වන්නේය.
- නොසන්සුන, දුක සහ වේදනාව වැන්න ඉවත් වන්නේය.
- පාප කර්මයන් සිත ආවරණය නොකර සිත පහන් වන්නේය.
- ඔහුගේ ආහාරය සංවර්ධනය වන්නේය.
- වන්දනාමානයන් පහසු කරන්නේය.
- පුළුල් ඥානයක් ලබන්නේය.
- මිනිසුන් අතර ඔහු ගැන යහපත් අදහසක් ඇති වන්නේය.
- ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරනු ලබන්නේය.
- ඔහුගේ මුහුණ කාන්තිමත් වී මිනිසුන් අතර ඔහු ගැන ශ්‍රධාවන්තයෙක් යනුවෙන් වූ බියක් ඇති වන්නේය.
- ඔහුට අයුක්තියක් වන කල අනෙක් අය මැදිහත් වන්නේය.
- ඔහුගේ ප්‍රාර්ථනාවට වහා පිළිවදන් ලැබෙන්නේය.
- ඔහු සහ අල්ලාහ් අතර වූ තනිකම ඉවත් වන්නේය.
- සුර දූතයන් ඔහු වෙත ලං වන්නේය.
- ෂයිතාන් සහ ජින්වරු ඔහුගෙන් ඉවත්ව යන්නේය.
- මරණ බිය ඉවත් වන්නේය.

- ලෞකික සම්පත් අල්ප එකක් බව වටහා ගන්නේය.
- මතුලොව මහිමය පුළුල් වන්නේය.
- අසහාය ජයග්‍රහණයට සිත ලොල් වන්නේය.
- අල්ලාහ්ට අවනත වීමෙහි සතුටක් හඟින්නේය.
- ඊමාන්හී සතුට ලබන්නේය.
- අල්ලාහ්ගේ සිහසුන මසවා ගෙන සිටින්නන් සහ අල්ලාහ් අසල පසුවන සුරදූතයන් ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරන්නේය.
- පව් සහ පින් ලියන සුරදූතයන් ඔහු කෙරෙහි සතුටු වන්නේය.
- චින්තනය, ශක්තිය සහ ඊමාන් වැන්න ප්‍රගුණ වේ.
- අල්ලාහ් ඔහු කෙරෙහි ප්‍රිය වන්නේය.
- ඔහුගේ පව් සමාව මගින් හෙතෙම සතුටු වන්නේය.
- ඔහු ජීවිතක්ෂයට පත්වූ කළ සුරදූතයන් ඔහු වෙනු වෙන් සුභාශිංෂනය කරන්නේය.
- මතුලොවේදී සියලු දෙනා රශ්ණයෙන් සහ දහඩියෙන් හෙම්බත්ව පසු වෙද්දී හෙතෙම අර්ෂ්හී සෙවනැල්ලේ පසුවන්නේය.
- දුක සහ කරදරය ඔහුට කිසිදාක නොවන්නේය.
- හිරිහැරයෙන් පිරුණු ලෞකික ජීවිතයේ සිට සුඛෝප භෝගී ස්වර්ගය වෙත කැඳවා ගෙන යනු ලබන්නේය.
- අල්ලාහ්ගෙන් සමුගන්නා විට අල්ලාහ්ගේ කීකරු අතවැසියන් සහ ජයග්‍රහකයන් විසින් ඔහු කැඳවා ගෙන යනු ලබනු ඇත.

## පවේ අඩුවම දුරස්ථ කරන කාරණාවන්

හිතවත, අල්ලාහ් දෙවිඳුගේ කරුණාවේ වැදගත් කරුණ වන්නේ අප කෙනෙකුත් වැරදි කළද ඒ වෙනුවෙන් අල්ලාහ් දෙවිඳු අප කෙරෙහි කෝප වී අපගේ පවසමා අයදීමේ අවස්ථාව තහනම් නොකර තිබෙන අතර, අල්ලාහ් වෙත බැතිසිතින් පශ්චාත්තාප වී අඬා වැළපී පව සමා අයදින විට ඔහු අපගේ සියලු පව සමා වන්නේය. කෙනෙකුගේ දෙමාපියන් සහ දුදරුවන් කොපමණ ආදරයෙන් සහ කරුණාවෙන් ඔහු සමග පසු වනවාදෝ එයට වඩා අපමණ ගුණයකින් කරුණාන්විත අල්ලාහ් දෙවිඳු මිනිසා කෙරෙහි ආදරය කරුණාව දක්වන හෙයින් ඔහුගේ අනුග්‍රහයන් සහ වරප්‍රසාධයන් මිහිපිට පුරා ව්‍යාප්ත වී පැතිරී පවතින්නේය. එහෙයින් අතවැසියන් තමන් කළ පව සහ දුදන ක්‍රියාවන් ගැන සිතාන්තාව දුක්වී පශ්චාත්තාප වී මීට පසු එවැනි පාප කර්මයන්හී නොනියළෙන බව ප්‍රතිඥා වී පව සමා අයදිය යුතුව ඇත. එසේ පව සමා අයදින විට කරුණාබර අල්ලාහ් දෙවිඳු අපගේ සියළු පාපයන් පහසුවෙන් සමා වන්නේය.

සමහර විට අතවැසියෙකු නොදැනුවත්ව වැරදෙහි බැඳෙන්නට හැකිය. ඔහු එසේ වැරදි කළ වහාම ඔහුට අඩුවම දිය යුතුය යනුවෙන් කරුණාබර අල්ලාහ් දෙවිඳුගේ නියදියක් නැත. වෙනුවට ඒ දුදනෙන් සහ වැරදිවලින් තමා පිරිසිදු කිරීමේ මාවත්ද අල්ලාහ් දෙවිඳු සූදානම් කර දී ඇත. අල්ලාහ් දෙවිඳුගේ ඒ කරුණා න්විත භාවය ගැන ඔහුම පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

﴿وَهُــوَ الَّذِي يَقْبَلُ التَّوْبَةَ عَنْ عِبَادِهِ وَيَعْفُو عَنِ السَّيِّئَاتِ وَيَعْلَمُ مَا تَفْعَلُونَ﴾

'තම අනවැසියන්ගේ තව්බාව (පසුතැවිලි වී පව් සමා අයැදීම) අනුමත කරන්නේ ඔහුය. ඔවුන්ගේ වැරැදීන් සමා කරන්නේය. තවද ඔහු ඔබ කරන සියලු දේ මනාව දන්නේය'. (42 : 25)

තවද පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි :

﴿ إِنَّ الْحَسَنَاتِ يُذْهِبْنَ السَّيِّئَاتِ ﴾

ඇත්තෙන්ම යහකම්, අයහකම් පහ කර හරින්නේය. (11 : 114)

විශාරද ශෛකුල් ඉස්ලාම් ඉබ්නු තයිමියා තුමා මෙසේ විස්තර කරයි: අනවැසියෙකු වරදක් කල විට මතු සඳහන් දස කරුණු මගින් එහි දඬුවමෙන් ගෙතෙම ආරක්ෂා ලබන්නේය. ඒවා මෙසේ වෙ.

- ඔහු කළ පව් වෙනුවෙන් පිරිසිදු චේතනාවෙන් පව් සමා අයැදීම. එසේ කලේ නම් ඔහුගේ පව් අල්ලාහ් දෙවිඳු විසින් සමා වන්නේය.

- අල්ලාහ් වෙත සැමදා පශ්චාත්තාප වීම. එසේ කිරීමෙන් අල්ලාහ් පව් සමා විය හැකිය.

- කළ පව් විනාශ වන හෝ මැකෙන අයුරු යම් කුසල් කර්මයන් කිරීම. එසේ කිරීමෙන් කළ පව් මැදක් හෝ අඩු විය හැකිය.

- ඔහුගේ බියබැති හිතවතුන් සහ සහෝදරයන් ඔහු වෙනුවෙන් පව් සමා අයැද පව් සමාව අයදීම පිණිස මැදිහත් වීම.

- හැකි අයුරින් ඔහුට හොඳ විය හැකි යම් යම් ගුණ දහමන් කියා දීම.

- ඔහු වෙනුවෙන් මුහම්මද් නබි තුමාගේ රෙකමාදුර සහ මැදිහත් වීම බලාපොරොත්තු වීම.

- ඔහුගේ සේසත්, ළමයින් සහ අනෙකුත් ඒවා කෙරෙහි අල්ලාහ් දෙවිඳුගේ පරීක්ෂණයට පත්වන විට ඒ අස්ථාවන්හි ඔහු ඉවසිලි වන්තව කටයුතු කිරීම.

- ජීවිතක්ෂයට පත්වී ඔහු මිනිවලේ තැබුවායින් පසු මිනිවල ඔහු තද කිරීමෙන් පව් තුනි වීම.

- ඔහුගේ පව් ඉවත් වන අන්දමින් පරමාන්ත දිනයේ මහ්ෂර් නම් විවෘත එළිමහනේදී තද රශ්මිය සහ ඩහදිය මගින් අඩුවමට භාජණය වීම.

- කිසිදු හේතුවකින් තොරව අල්ලාහ්ගේ අනුග්‍රහයෙන් පව් සමා ලැබීම.

අල්ලාහ්ට බිය නොවී පසුවන්නනි,

ඉබ්ලීස් නම් ෂයිතාන් අල්ලාහ් දෙවිඳුට ඉතා සමීපව පසු වූ කෙනෙක් බව ඔබ මනාව දනී. ඔහුට අල්ලාහ් දෙවිඳු විසින් අණදා කළ සුජූදයක් කිරීමට ඔහු ප්‍රතික්ෂේප කර පසුබට වූ නිසා එවන් උසස් ස්ථානයේ සිට අල්ලාහ් දෙවිඳු විසින් ඔහු නින්දාවට පත්කර පහළ

තත්ත්වයකට පත් කළ සිද්ධිය අමතක කිරීමෙන් වළකින්න. තහනම් කළ එක් ගසකින් එලතුරක් කා නිසා මුල්ම මිනිසා ආදම් පවා ස්වර්ගයෙන් පිටමං කළ බව ඔබ මනාව දන්නා කරුණකි. තවද කෙනෙකු තව කෙනෙකු ඝාතනය කළ නිසා මනහර ස්වර්ගයටට ඇතුල් වීම තහනම් කර ඇත.

දුරාචාරයෙහි හැසිරෙන්නා තම මර්මස්ථානය එක් ඇඟිලි පුරුකක් පමණ කුඩා කොටසක් නොමනා ස්ථානයකට ඇතුල් කළ හෙයින් ඝාතනය කරන ලෙස ඉස්ලාම් දහම මගින් අණදා ලබයි. පතිවත ස්ත්‍රීන්ට සහ අනුන් හට අවලාද කරන්නන් සහ සුරාපානය කරන්නන් කස පහර දී අඬුවම් කරන ලෙස ආඥා ලැබී ඇත. දිර්හම් තුනක්වැනි සුළු භාණ්ඩයක් සොරකම් කරන්නාගේ අත සිඳින ලෙස අනපනවා ඇත. එහෙයින් මිනිසා කරන එක් එක් වැරැදි සහ දුදන ක්‍රියාවන් සඳහාම නිරයේ ගින්නේ වේදනාව ලැබෙන බව අමතක නොකරන්න. එසේ අඬුවම් නියම කර තිබෙද්දීද දැනදැන වරදෙහි බැඳෙන්නන් ගැන සර්ව බල අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආයේ මෙසේ විස්තර කරයි :

﴿وَلَا يَخَافُ عُقْبَاهَا﴾

*එහි විපාකය ගැන ඔහු බිය නොවෙයි.* (91 : 15)

අහිංසක බළලෙකුට බැඳ දමා කළ හිංසයක් නිසා කාන්තාවක් නිරයට ඇතුල්වූ සිද්ධියක් මුහම්මද් නබි තුමා වරෙක විස්තර කළහ. අප අනුන් සමග පාවිච්චි කරන එක් එක් වචනයේ බැරෑරුම් කම ගැන මනාව අවබෝධ කර ගැනීමට අසමත් වීමෙන් එහි විපාකය

නිසා විඳින අඩුවම ගැන පවසන කළී හෙතෙම නැගෙන හිරටත් බස්නාහිරටත් අතර වූ දුර විශාල ප්‍රමාණයක නිරයේ විසි කරන බව දහම සඳහන් කරයි. කෙනෙකු අවුරුදු හැටක් පමණ වූ දීර්ඝ කාලයක් අල්ලාහ් දෙවිඳුට කීකරු වී යහකර්මයන් කර ශ්‍රද්ධාවන්තයෙකු ලෙස මැරෙණ අවසන් මොහොතේ නිරයට යන්න්ට තරම් වූ එක් අකුසල් කර්මයක් කර නිරයට ඇතුල් වූ සිද්ධියක් ගැනද වරෙක මුහම්මද් තුමා දේශනා කළහ. යමෙකු ශ්‍රධාවන්තයෙක්ද දුදනෙක්ද යන්න තීරණය වන්නේ ඔහුගේ අවසාන මොහොතේ යන්න බව මෙයින් මනාව වටහා ගත හැකිය.

එසේම කෙනෙකුගේ දේව නැමදුමේ සලාම් කීමට සුළු මොහොතකට පෙර අවසාන අවස්ථාවේ ඔහුට වාතයක් පිටවී නම් ඔහුගේ දේව නැමදුම අවලංගු වන්නේය. එසේම යමෙකු දහවල් කාලය මුළුල්ලේම කුසගින්නේ උපවාසය ශීලය රැක උපවාශය අවසන් කිරීමට සුළු වෙලාවකට කළින් යමක් අනුභව කරන විට ඔහුගේ උපවාසය නිෂ්ප්‍රභා වන්නේ නම් ඔහු දවස පුරාම මහත් පරිශ්‍රමයකින් කුස ගින්නේ සිටිය ප්‍රයෝජනය නැති වන්නේය. යමෙකු තම ජීවිතය කාලයේ මැරෙන්නට කළින් අවසාන පැයේ වරදක් කරන්නේද හෙතෙම ඒ විලසින්ම එනම් අවසන් වශයෙන් කළ ඒ පව සමග අල්ලාහ් මුණ ගැසෙන නීච තත්ත්වයට පත් වන්නේය. එහෙයින් අප කරන සියළු කටයුතු ආගම පවසන අන්දමින් විය යුතු බව තරයේ මතක තබා ගත යුතුය.

එහෙයින් අසම්පූර්ණවූ ඌන ර්මානය සමගද, ආගමට පටහැනි අන්දමින් සිතුමතේ ක්‍රියා කරන විශාල

චින්තනයන් සමගද, එවන් නිහතමානීත්වයක් නොවූ භයානක රෝග සහිතවද, සෑම මොහොතකම කුසලෙහි යෙදීමට උත්සාහ දරමින් සිටින සිතකින්ද, යහකම් කළ යුතුය යන වූ චින්තනා ශක්තියක් නැති අධිෂ්ඨානයකින්ද, සෑම මොහොතකම දහමට පටහැනි වූ මුග්ධ අදහස්හී නිරත වෙමින්ද, දහම ගැනවූ ස්ථිර විශ්වාසයෙන් තොරවූ චින්තනයන් හා අල්ලාහ් දෙවිඳුට ඉතා ඈතින් පසු වෙමින්ද, ඔහුගේ නිර්මාණයන් හා සම්මිශ්‍රණය කර ඔහුට ආදේශ කරමින්ද, ජනයන් අතර නිතරතිතර ඔපදූප දොඩමින්ද, අල්ලාහ් දෙවිඳු සිහිකරන සිත අඩපන කරමින්ද, ඔබගේ බාහිර ජීවනය හා සම්බන්ධ කටයුතු සහ ප්‍රිය මනාප අල්ලාහ් අභියස සුළු ඒවා ලෙස නැකූ දේ වෙත යොමු කරද, සිත අල්ලාහ්ට ඈත් කරද කටයුතු කරන්නේ නම් ඔබ ජය ග්‍රහකයෙකු වන්නේ කෙසේද?

එහෙයින් අල්ලාහ්ට අකීකරු නොවී ඔහු පමණක් නිහතමානී ලෙස වන්දනාමාන කරන අය ලෙසටද මතුලොව අපගේ සිත මදහසෙන් පිරුණු එකක් ලෙසද ස්වර්ගයේ අල්ලාහ්ගේ මුහුණ දැක ගැනීමට හැකි භාග්‍ය වන්තයන් ලෙසද සර්ව බල අල්ලාහ් දෙවිඳු අප සැමට අනුග්‍රහය දක්වත්වා.

මුහම්මද් තුමාටද එතුමාගේ පවුලේ අයටද එතුමාගේ ශ්‍රද්ධාවන්ත කලණ මිතුරන්දට සදා ශාන්තිය සහ සමාදානය උදා වේවා!

وصلى الله تعالى وسلم على نبينا محمد وعلى آله وصحبه وسلم.

مطابع الحميضي
AL HOMAIDHI PRESS - TEL . 4581000 - FAX : 4592217

## كتاب : إلى متى العصيان؟

## محتويات الكتاب :


- المقدمة
- مرارة الحسرة
- إياك والمعصية
- المعاصى سبب هلاك الأمم
- أصول المعاصى
- أنواعها
- إلى متى العصيان؟
- أضرار الذنوب والمعاصى على الفرد
- التوبة
- أجناس المحرمات
- أسباب ترك المعاصى
- الإحتجاج بالقدر على المعاصى
- فوائد ترك المعاصى

# إلى متى العصيان؟

## باللغة السنهالية

تأليف

القسم العلمي بدار الوطن

الترجمة

عبد الحكيم محي الدين

المراجعة

محمد ناصم




## إلى متى العصيان ؟

تأليف :
دار الوطن

ترجمة :
عبدالحكيم محي الدين

دار القاسم للنشر والتوزيع
الرياض - الشفا - هاتف وفاكس : ٤٢٣٨٨٣٧

ردمك: ٩٩٦٠-٨٤٣-٥٢-١